
# සටහන

2015 මැයි - ජූනි

5 - 6 කලාපය




ජපානයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක් 2

ලෝකය අන්ත දුගීභාවය හා සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය ජයගනී ද? 3

ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය 14

ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික සංවර්ධනයට ශක්තියක් වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල කාර්යභාරය 18



ISSN 1391-3697


9 780041 000917

04100091 Rs.20.00


රු. 20/-


සන්නිවේදන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව



# ජපානයේ
## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



නැගෙනහිර ආසියානු කලාපයට අයත් ජපානය පැසිපික් සාගරයෙහි පිහිටියේ ය. එය දූපත් රාශියකින් සමන්විත වේ. එම දූපත් අතරින් හොන්ෂු, හොකයිදෝ, ක්‍යුෂූ සහ ෂිකොකු ප්‍රධාන ය. ජපානයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 97 ක් මෙම දූපත්වලට අයත් ය. එහි අගනගරය ටෝකියෝ ය. ජපානය එක්සත් ජාතීන්ගේ සංවිධානය, G7, G8 සහ G20 සංවිධානවල සාමාජිකයෙක් වේ. මෙය නිෂේධ බලය හිමි රටකි. ජපානය නාමික දළ දේශීය නිෂ්පාදිතය අනුව ලොව තෙවැනි ස්ථානයේත් ක්‍රය ශක්ති සාම්‍ය අනුව සිව් වැනි ස්ථානයේත් පසුවෙයි. එ මෙන් ම අපනයන අනුව ලොව පස් වැනි ස්ථානයේ පසුවන ජපානය ආනයන අනුව ද පස්වැනි ස්ථානයේ පසුවෙයි. මෙය සංවර්ධිත රටකි. මානව සංවර්ධන දර්ශකය ශ්‍රේණිගත කිරීම් අනුව ඉහළ ශ්‍රේණියක පසුවෙයි. ලොව ඉහළ ම ජීවිත අපේක්ෂාව සහිත රට ජපානය යි. එ මෙන් ම ලොව ළදරු මරණ අනුපාත පෙළ ගැස්මට අනුව තෙවැනි පහළ ම ළදරු මරණ අනුපාතය වාර්තා වන්නේ ජපානයෙනි. ජාතික ප්‍රතිරූප දර්ශකය අනුව ජපානය පළමු තැන පසුවෙයි.

2012 බලයට පත් සින්ෂෝ අබේ ජපානයේ වර්තමාන අගමැතිවරයා ය.

| | |
|---|---|
| භූමි ප්‍රමාණය | වර්ග කි. මී. 377,915 |
| ජනගහනය (2015 ජූලි ඇස්තමේන්තු) | 126,919,659 |
| ජනගහන වර්ධන වේගය (2015 ඇස්තමේන්තු) | -0.16% |
| ජන ඝනත්වය | වර්ග කිලෝ මීටරයට පුද්ගලයින් 337.1 |
| උපත් අනුපාතය (2015 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 7.93 |
| මරණ අනුපාතය (2015 ඇස්තමේන්තු)(ජනගහනය දහසකට) | 9.51 |
| උපතේදී ආයු අපේක්ෂාව (2015 ඇස්තමේන්තු) (අවුරුදු) | 84.74 |
| දළ දේශීය නිෂ්පාදිතය (ක්‍රය ශක්ති සාම්‍ය අනුව) 2014 ඇස්තමේන්තු) | එ.ජ. ඩොලර් ට්‍රිලියන 4.751 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2014 ඇස්තමේන්තු) | -0.1% |
| ඒක පුද්ගල ද.දේ.නි. (2014 ඇස්තමේන්තු) | එ.ජ. ඩොලර් 37,400 |
| ද.දේ.නි. යේ ආංශික සංයුතිය (2013 ඇස්තමේන්තු) | කෘෂිකර්මය 1.2%, කර්මාන්ත 24.5%, සේවා 74.3% |
| අයවැය අතිරික්තය (+) හිඟය (-) ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2014 ඇස්තමේන්තු) | -6.9 % |
| රාජ්‍ය ණය - ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (2014 ඇස්තමේන්තු) | 231.9% |
| උද්ධමනය (CPI)(2014 ඇස්තමේන්තු) | 2.7% |
| විදේශ සංචිත (2013 ඇස්තමේන්තු) | ඩොලර් ට්‍රිලියන 1,267 |
| සේවා වියුක්ති අනුපාතය (2014 ඇස්තමේන්තු) | 3.6% |
| සාක්ෂරතාව | 99% |
| ප්‍රධාන අපනයන | මෝටර් රථ, යකඩ සහ වානේ නිෂ්පාදන, අර්ධ සන්නායක, මෝටර් රථ කොටස්, විදුලිබල උත්පාදන යන්ත්‍ර, ප්ලාස්ටික් |
| ප්‍රධාන අපනයන රටවල් | එක්සත් ජනපදය, චීනය, දකුණු කොරියාව, හොංකොං, තායිලන්තය |
| ප්‍රධාන ආනයන | පෙට්‍රෝලියම්, ස්වභාවික ද්‍රව වායු, ඇඳුම්, අර්ධ සන්නායක, ගල් අඟුරු, ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය උපකරණ |
| ප්‍රධාන ආනයන රටවල් | චීනය, එක්සත් ජනපදය, ඔස්ට්‍රේලියාව, සවුදි අරාබිය එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කටාර්, දකුණු කොරියාව |
| ජපන් යෙන් / ශ්‍රී ලංකා රුපියල් අනුපාතය | 1.1745 (2015.09.30) |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

34 වෙළුම 5-6 කලාපය 2015 මැයි-ජුනි ISSN 1391-3697

වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# ලෝකය අන්ත දුගීභාවය හා සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය ජයගනී ද?

විනීතා හේරත්
සන්නිවේදන දෙපාර්තමේන්තුව

පොදුවේ සමස්ත ලෝකය ම මුහුණ දී ඇති එකිනෙකට බැඳුනු ආර්ථික, සමාජීය සහ පාරිසරික අභියෝග රැසකි. මේ අභියෝග ජයගනු වස් ඒ ඒ ජාතීන් වෙන් වෙන් වශයෙනුත් කලාපීය සහ නොයෙකුත් ආකාරයේ සංවිධාන ලෙසත් සීමා මායිම්වලින් බැහැර ව ජගත් ප්‍රජාව ලෙසත් විවිධාකාර පියවර ගනිමින් සිටී. මෙම පියවර අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් රැසක් විසින් 2015 වන විට සපුරා ගැනීමට එකඟතාවකට එළැඹ සිටින සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ කැපී පෙනේ. මෙම අභිමතාර්ථ කොටස් 8 ක් යටතේ දක්වා ඇති අතර ඒ ඒ අභිමතාර්ථ සපුරා ගැනීමෙහි ලා ජයගත යුතු ව ඇති ඉලක්ක රැසක් ද පිහිටුවා ඇත. මෙම අභිමතාර්ථ ඉටුකරගැනීම පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානය නිරන්තර අවධානයෙන් සිටී. මෙතෙක් ලබා ඇති ප්‍රගතිය, පසුබෑම් සහ ජයගත යුතු ව ඇති අභියෝග පිළිබඳ ව විමසා බලයි. සහස්‍ර සංවර්ධන අභිමාර්ථ සපුරාගැනීමට එකඟතාවට එළැඹ ඇති රටවල් තනි තනි ව ම ද මෙතෙක් ඒ ඒ රටවල් ලබා ඇති ප්‍රගතිය සහ අභිමතාර්ථ සපුරා ගැනීමට තවදුරටත් ගතයුතු පියවර පිළිබඳ ව අවධානය යොමුකරයි.

සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවල පළමු වැනි අභිමතාර්ථය ලෙස දැක්වෙන්නේ අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීම යි. මෙම අභිමතාර්ථය සපුරා ගැනීමෙහි ලා ළඟා වියයුතු ඉලක්ක 3 ක් පිහිටුවා ඇත. එම ඉලක්ක:

- 1990-2015 වන විට ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1 ට වඩා අඩු ජනගහනය අඩකින් අඩු කිරීම.
- කාන්තාවන් සහ තරුණයන් ඇතුළු සැමට යෝග්‍ය හා ඵලදායී රැකියා හා කාර්යයන්හි නියැලීමට සැලසීම තුළින් පූර්ණ රැකියා නියුක්තිය ඇති කිරීම.
- 1990-2015 සාගින්නේ සිටින ජන සංඛ්‍යාව අඩකින් අඩුකිරීම.

අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ අභිමතාර්ථය සපුරාගැනීම සම්බන්ධයෙන් ලෝකය මේ වන විට ලබා ඇති ප්‍රගතිය සහ එහි ලා ශ්‍රී ලංකාවේ මෑතකාලීන ප්‍රවණතා පිළිබඳ ව මෙම ලිපිය මගින් සැකෙවින් විමසා බැලීමට අපේක්ෂිත ය.


## 1990-2015 වන විට ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1ට වඩා අඩු ජනගහනය අඩකින් අඩු කිරීම.

දරිද්‍රතාව පිළිබඳ ජාත්‍යන්තර ගණන් බැලීම්වල දී අන්ත දිළිඳු බවින් පෙළෙන්නන් ලෙස සලකනුයේ ඒක පුද්ගල දෛනික ආදායම එක්සත් ජනපද ඩොලර් 1 හෝ 1.25ට වඩා අඩු ජනගහනය යි. ඒ අනුව අන්ත දුගීභාවය අඩුකිරීම සම්බන්ධ ව ලෝකය මේ වන විට සැලකිය යුතු තරමේ ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

1990 වසරේ ලෝක ජනගහනයෙන් බිලියන 1.9ක් අන්ත දුගීභාවයෙන් පෙළුන අතර 2011 වන විට එම සංඛ්‍යාව බිලියනයක් දක්වා පහළ වැටී ඇත. 2015 දී මෙම සංඛ්‍යාව මිලියන 836ක් දක්වා තව දුරටත් පහළ වැටෙනු ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රක්ෂේපණය කර ඇත (1 වැනි රූපසටහන).

1 වැනි රූපසටහන

**ලොව ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1.25 ට වඩා අඩු ජනගහනය (මිලියන), 1990 - 2015**




මූලාශ්‍රය - The Millennium Development Goals Report 2015 - United Nations

1990 දී සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනගහනයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවකගේ දෛනික ආදායම ඩොලර් 1.25ට අඩු විය. 2011 දී මෙම අනුපාතය සියයට 18ක් දක්වා පහළ වැටී තිබිණි. 2015 දී මෙම ප්‍රතිශතය සියයට 14ක් දක්වා තවදුරටත් පහළ වැටෙනු ඇතැ යි ප්‍රක්ෂේපිත ය (1 වැනි සංඛ්‍යා සටහන). ඒ අනුව 2015 වන විට ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1ට වඩා අඩු ජනගහනය අඩකින් අඩු කිරීමේ ඉලක්කය වසර 5කට පෙර සපුරා ඇතැ යි සිතිය හැකි වුවත් මෙම ප්‍රගතිය ලොව පුරා සමාන ආකාරයෙන් බෙදී යෑමක් දක්නට නො ලැබේ. දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, නැගෙනහිර ආසියාව, ලතින් ඇමෙරිකාව හා කැරිබියන්, කොකේසස් හා මධ්‍යම ආසියාව සහ උතුරු අප්‍රිකාව වැනි කලාප රැසක් අන්ත දුගීභාවය අඩකින් අඩුකිරීමේ ඉලක්කය ජයගෙන ඇති අතර උප-සහරා අප්‍රිකානු කලාපය ඉලක්කයට සැහෙන දුරක් පසුපසින් සිටී. ලොව අන්ත දුගීභාවය අඩුකිරීමේ ඉලක්කය කෙරෙහි අධික ජනගහනයක් වෙසෙන චීනය හා ඉන්දියාව විශාල බලපෑමක් ඇති කරයි. ඒ අනුව මෑත වසරවල චීනයේ ඇති වූ ආර්ථික වර්ධනය හේතුවෙන් 1990 වසරේ නැගෙනහිර ආසියාවේ සියයට 61ක් වූ අන්ත දරිද්‍රතා අනුපාතය 2015 දී සියයට 4ක් දක්වා සියයට 94 කින් පහළ වැටී ඇත. එම කාල පරිච්ඡේදයේ දකුණු ආසියානු කලාපයේ අන්ත දරිද්‍රතා අනුපාතයේ පහළ වැටීම සියයට 66කි.

ලොව අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනයෙන් බහුතරයක්, එනම් සියයට 80ක් පමණ වෙසෙන්නේ දකුණු ආසියා සහ උප-සහරා අප්‍රිකා කලාපවල යි. 2011 වසරේ බිලියනයක් පමණ වූ ලොව අන්ත දුගීභාවයෙන් පෙළුන ජනගහනයෙන් සියයට 60ක් පමණ නියෝජනය කරන ලද්දේ ඉන්දියාව, නයිජීරියාව, චීනය, බංගලාදේශය සහ කොංගෝව යන රටවල් 5 විසිනි. අන්ත දරිද්‍රතාවෙන් පෙළුන ජනගහනයෙන් 1/3ක් ම අයත් වූයේ ඉන්දියාවට යි.

ශ්‍රී ලංකාව අන්ත දුගීභාවය අඩකින් අඩුකිරීම සම්බන්ධ ඉලක්කය වසර හතකට පෙර ජයගැනීමට සමත් ව

1 වැනි සංඛ්‍යා සටහන

**දෛනික ආදායම ඩොලර් 1.25ට වඩා අඩු ජනගහන ප්‍රතිශතය (කලාපීය වශයෙන්) 1990, 2011 සහ 2015**

| කලාපය | 1990 | 2011 | 2015 (ප්‍රක්ෂේපිත) |
|---|---|---|---|
| උප-සහරා අප්‍රිකාව | 57 | 47 | 41 |
| දකුණු ආසියාව | 52 | 23 | 17 |
| දකුණු ආසියාව (ඉන්දියාව හැර) | 53 | 20 | 14 |
| අග්නිදිග ආසියාව | 46 | 12 | 7 |
| නැගෙනහිර ආසියාව (චීනය පමණි) | 61 | 6 | 4 |
| ලතින් ඇමෙරිකා හා කැරිබියන් | 13 | 5 | 4 |
| කොකේසස් සහ මධ්‍යම ආසියාව | 8 | 4 | 2 |
| බටහිර ආසියාව | 5 | 2 | 3 |
| උතුරු අප්‍රිකාව | 5 | 2 | 1 |
| සංවර්ධනය වෙමින් පවත්නා රටවල් (චීනය හැර) | 41 | 22 | 18 |
| සංවර්ධනය වෙමින් පවත්නා රටවල් | 47 | 18 | 14 |
| ලෝකය | 36 | 15 | 12 |

මූලාශ්‍රය:The Millennium Development Goals Report 2015 - United Nations

සිටී. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල දරිද්‍රතා රේඛාවක් හඳුන්වා දී තිබේ. 1990-1991 දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූ ජනගහන ප්‍රතිශතය සියයට 26.1ක් වූ අතර එය 2015 වන විට සියයට 13.1ක් දක්වා පහළ දැමීම ඉලක්කය විය. එහෙත් 2008 දී අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන්නන් අඩකින් අඩුකිරීමේ ඉලක්කය ජයගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය (2 වැනි සංඛ්‍යා සටහන). නිදහසින් පසු බලයට පත් සෑම රජයක් විසින් ම පාහේ අනුගමනය කරන ලද සුබසාධන ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩුකිරීමට හේතු වී ඇත. ඒ සඳහා මෑතකාලීන උදාහරණ ලෙස ජනසවිය, සමෘධි වැඩසටහන, දිවි නැගුම, පොහොර සහනාධාරය වැනි සුබසාධන වැඩසටහන් දැක්විය හැක. දරිද්‍රතාව අඩුකිරීම සම්බන්ධ මෙම ජයග්‍රහණ ජාතික මට්ටමේ දී පමණක් නො ව නාගරික සහ ග්‍රාමීය වශයෙන් අංශ අනුව ද දැකගත හැක. 2012-2013 ශ්‍රී ලංකාවේ දිළිඳු ජනගහනයෙන් සියයට 86.8ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වූ අතර නාගරික හා වතු අංශයේ පිළිවෙලින් එම ප්‍රතිශතය සියයට 5.6ක් හා සියයට 7.6ක් විය. දිළිඳු ජනගහනය අඩුවීමේ ජාතික මට්ටමේ ප්‍රවණතාව ඒ හා සමාන ව ම ග්‍රාමීය අංශය සම්බන්ධ ව ද දැකිය හැක. 2015 දී ග්‍රාමීය අංශයේ දරිද්‍රතාව අඩුකිරීමේ ඉලක්කය සියයට 14.8ක් වුවත් 2012-2013 එම ප්‍රතිශතය අපේක්ෂිත ඉලක්කයෙනුත් අඩක් දක්වා පහළ බැස ඇත. එ මෙන් ම නාගරික අංශයේ දිළිඳු ජනගහනය අඩුකිරීමේ ඉලක්කය 8.3ක් වුවත් එය සියයට 2.1ක් දක්වා පහළ බැස ඇත. වතු අංශය සම්බන්ධ ව 2015 දී සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයට ඉතාමත් ම ආසන්නයට පැමිණීමට 2012-2013 වන විට සමත් වී ඇත. අනෙකුත් අංශ දෙක හා සාපේක්ෂ ව ගත් විට වතු අංශයේ දිළිඳු ජනගහනය අඩුවීමේ ප්‍රවණතාව මන්දගාමී යැයි හැඟෙතත් 1995-1996 වතු අංශයේ ජනගහනයෙන් නිල දරිද්‍රතා රේඛාවට පහළින් වූ ජනගහන ප්‍රතිශතය වූ සියයට 38.4 හා 2006- 2007 සියයට 32ක් වූ ප්‍රතිශතය 2009-2010 සහ 2012-2013 දී අඩකටත් වඩා අඩු වී ඇත.

2 වැනි සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අඩුකිරීම සම්බන්ධ ප්‍රගතිය**

| | නිල දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූ ජනගහන ප්‍රතිශතය | | | | | 2015 ඉලක්කය | තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | 1990-1991 | 2002 | 2006-2007 | 2009-2010 | 2012-2013 | | |
| ශ්‍රී ලංකාව | 26.1 | 22.7 | 15.2 | 8.9 | 6.7 | 13.1 | ඉලක්කය සපුරා ඇත |
| නාගරික | 16.3 | 7.9 | 6.7 | 5.3 | 2.1 | 8.3 | |
| ග්‍රාමීය | 29.5 | 24.7 | 15.7 | 9.4 | 7.6 | 14.8 | |
| වතු | 20.5 | 30.0 | 32.0 | 11.4 | 10.9 | 10.3 | |
| අන්තර් දරිද්‍රතා දර්ශකය | 5.6 | 5.0 | 3.1 | 1.7 | 1.2 | 2.8 | |

මූලාශ්‍රය: Millennium Development Goals Country Report 2014


දරිද්‍රතාව අඩුකිරීම සම්බන්ධ ව ජාතික මට්ටමින් සුභදායී තත්ත්වයක් දැකිය හැකි වුවත් ප්‍රාදේශීය වශයෙන් එහි විෂමතා දක්නට ලැබේ. 1990 ගණන්වල ආරම්භයේ දකුණ, ඌව, සබරගමුව යන පළාත් තුනේ සියලු ම දිස්ත්‍රික්කවල සහ කළුතර සහ මහනුවර දිස්ත්‍රික්කවල සාමාන්‍ය දරිද්‍රතා අනුපාතය සියයට 30ක් පමණ විය. එහෙත් 2012 ජූලි - 2013 ජූනි දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සියලු ම දිස්ත්‍රික්ක ඇතුළත් වන පරිදි පවත්වන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය පදනම් කර ගනිමින් කර ඇති ඇස්තමේන්තුවලට අනුව 2009-2010 දිස්ත්‍රික්ක රැසක දරිද්‍රතාව අඛණ්ඩ ව පහළ බැස ඇත. අම්පාර සහ යාපනය දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් මේ තත්ත්වය කැපී පෙනේ. 2009-2010 යාපනය දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතා අනුපාතය සියයට 16.1ක් වූ අතර 2012-2013 එය සියයට 8.3ක් දක්වා වසර තුනක් තුළ සියයට 50 කින් පමණ පහළ බැස ඇත. මෙම කාල පරිච්ඡේදයේ අම්පාර දිස්ත්‍රික්කයේ දරිද්‍රතාව සියයට 11.8 සිට 5.4 දක්වා පහළ බැස ඇත. අනෙකුත් දිස්ත්‍රික්ක පිළිබඳ ව විමසා බැලීමේ දී කොළඹ දිස්ත්‍රික්කයෙහි දරිද්‍රතාව සියයට 3.6 සිට 1.4 දක්වාත් කළුතර දිස්ත්‍රික්කයේ සියයට 6 සිට 3.1 සහ ගම්පහ දිස්ත්‍රික්කයේ සියයට 3.9 සිට 2.1 දක්වාත් පහළ වැටී ඇත. මොණරාගල, වව්නියා, අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කවල දරිද්‍රතා අනුපාතයේ ඉහළ යෑමක් දක්නට ලැබේ. ඇස්තමේන්තු අනුව ඉහළ ම දරිද්‍රතා අනුපාත වාර්තා වන්නේ මුලතිව් (සියයට 28.8) සහ මන්නාරම් (සියයට 20.1) දිස්ත්‍රික්කවලිනි.

- **කාන්තාවන් සහ තරුණයන් ඇතුළු සැමට යෝග්‍ය හා ඵලදායී රැකියා හා කාර්යවල නියැලීමට සැලසීම තුළින් පූර්ණ රැකියා නියුක්තිය ඇති කිරීම.**

ආර්ථිකයක දරිද්‍රතාව දුරලීමට නම් එහි ජීවත්වන්නන් සඳහා ප්‍රමාණවත් ආදායම් ලැබිය හැකිවන ලෙස රැකියා අවස්ථා ජනනය විය යුතු ය. මේ නිසා අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය සපුරාගැනීමේ දෙවැනි ඉලක්කය වී ඇත්තේ කාන්තාවන් සහ තරුණයන් ඇතුළු සැමට යෝග්‍ය හා ඵලදායී රැකියා හා කාර්යවල නියැලීමට සැලසීම තුළින් පූර්ණ රැකියා නියුක්තිය ඇති කිරීම යි. ලොව ජනගහන වර්ධනයත් සමඟ පුළුල් වන ශ්‍රම බලකායේ රැකියා ඉල්ලුම සපුරාලීමට නම් ආර්ථිකය වර්ධනය විය යුතු ය. එහෙත් ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ මන්දගාමී ස්වරූපය සහ අසමාන බව ලෝක ශ්‍රම වෙළෙඳපොළ කෙරෙහි ඉතාමත් ම අහිතකර ආකාරයෙන් බලපෑවේ ය. 1991 වසරේ ලොව ජනගහනයට රැකියා අනුපාතය (employment to population ratio), එ නම් වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් සේවා නියුක්ත ජන කොටස සියයට 62ක් වූ අතර 2015 වන විට එම ප්‍රතිශතය සියයට 60ක්

2 වැනි රූපසටහන

**කලාපීය වශයෙන් ජනගහනයට රැකියා අනුපාතය, (සියයට) 1991 සහ 2015**




මූලාශ්‍රය:The Millennium Development Goals Report 2015 - United Nations

දක්වා පහළ වැටී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රක්ෂේපණවලට අනුව 2015 දී රැකියා විරහිත ලෝක ජනගහනය මිලියන 204කට අධික වනු ඇත. එය 1991 වසරට වඩා මිලියන 53ක වර්ධනයකි. සංවර්ධනය වෙමින් පවත්නා සහ සංවර්ධිත රටවල් කාණ්ඩ දෙකෙහි ම රැකියා අවස්ථා අඩුවී ඇත (2 වැනි රූපසටහන).

1991-2015 සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනගහනයට රැකියා අනුපාතය සියයට 3.3කින් පහළ වැටී ඇත. එම කාලයේ සංවර්ධිත රටවල ජනගහනයට රැකියා අනුපාතයේ පහළ වැටීම සියයට 1 කි. සියයට 6.7 සහ සියයට 4.6ක් වූ විශාලත ම පහළ වැටීම් දක්නට ලැබෙන්නේ පිළිවෙළින් නැගෙනහිර ආසියානු කලාපයේ සහ දකුණු ආසියානු කලාපයේ ය.

1991-2015 ලොව අවුරුදු 15-24 තරුණ වයස් කාණ්ඩයේ සේවා නියුක්තියේ සියයට 10ක පහළ වැටීමක් වාර්තා වෙයි. එහෙත් වැඩිහිටි වයස් කාණ්ඩයේ රැකියා වියුක්තියට වඩා තරුණ වයස් කාණ්ඩයේ රැකියා වියුක්තිය තුන් ගුණයකට වඩා විශාල ය. ඒ අනුව 2015 මිලියන 74ක පමණ තරුණ ජනගහනයක් රැකියා අපේක්ෂාවෙන් සිටී. මෙහි ලා උතුරු අප්‍රිකාවේ සහ බටහිර ආසියාවේ තත්ත්වය ඉතාමත් ම උග්‍ර ය. එම කලාපවල සමස්ත වැඩ කළ හැකි ජනගහනයෙන් රැකියා නියුක්ත ජනගහනය පිළිබඳ ව විමසා බැලීමේ දී තරුණ ජනගහනයෙන් සේවා නියුක්ත ව සිටින්නේ අඩක් පමණක් බව දක්නට ලැබේ.

එ මෙන් ම සේවා නියුක්ත ව සිටිය ද ලොව පුරා ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් දරිද්‍රතාවෙන් මිදීමට

ප්‍රමාණවත් ආදායමක් නො ලබයි. 1991 සංවර්ධනය වෙමින් පවත්නා රටවල ශ්‍රමිකයන්ගෙන් අඩකගේ පමණ ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1.25ට වඩා අඩු මට්ටමක පැවතිණි. 2015 වන විට මෙම අනුපාතය සියයට 11ක් දක්වා පහළ වැටී ඇත.

පසුගිය දශක දෙක හමාර තුළ ලොව අන්ත දුගීභාවයෙන් පෙළෙන ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව ක්‍රමානුකූල ව පහළ වැටී ඇත. 1991 දී මිලියන 900ක් පමණ ශ්‍රමිකයන්ගේ දෛනික ඒක පුද්ගල ආදායම ඩොලර් 1.25 ට වඩා අඩු මට්ටමක පැවති අතර 2015 දී මෙම සංඛ්‍යාව මිලියන 300ක් දක්වා අඩුවී ඇත. කෙසේ වෙතත් දරිද්‍රතාව පහළ වැටීම සම්බන්ධ මෙම ප්‍රගතියෙහි කලාපීය වශයෙන් විෂමතා දක්නට ලැබේ. 2015 දරිද්‍රතා මට්ටමේ සිටි ශ්‍රමිකයන්ගෙන් සියයට 80ක් පමණ නියෝජනය කරන්නේ උප-සහරා අප්‍රිකාව සහ දකුණු ආසියාව ය.

ඇතැම් අවස්ථාවල සේවා නියුක්ත ව සිටිය ද රැකියාවේ අවිධිමත් ස්වභාවය සහ අවිනිශ්චිත බව නිසා ශ්‍රමිකයන් ඉතාමත් ම පහසුවෙන් යළි දරිද්‍රතාවට ඇද වැටීමේ ඉඩකඩ පවතී. අවදානමට ලක්වීමේ සම්භාවිතාවක් සහිත (Vulnerable Employment) සහ ගුණාත්මක බවින් පහළ (Low-quality) රැකියා කරන්නන්ගේ සමාජ සුරක්ෂිතතාව නිසි ලෙස සහ ප්‍රමාණවත් ව තහවුරු කෙරෙන්නේ නැත. ආදායම් ඉපයීම පහළ මට්ටමක පවතී. ඉතා සුළු පිරිසක් සමාජ ආරක්ෂණ ක්‍රමවලින් ආවරණය වුවත් එවැනි ආරක්ෂණ විධි ලොව සෑම කලාපයක ම එක ම ආකාරයෙන් ව්‍යාප්ත ව ඇති බවක් දක්නට නො ලැබේ. කෙසේ වෙතත් ලොව අවදානමට ලක්වීමේ වැඩි සම්භාවිතාවක් සහිත රැකියා, ස්වයං රැකියා සහ පවුලේ කටයුතු සඳහා දායකවීම අඛණ්ඩ ව පහළ වැටෙමින් තිබේ. විශේෂයෙන් ම නැගෙනහිර ආසියාවේ මේ තත්ත්වය කැපී පෙනේ. 1991 දී මෙම කලාපයේ අවදානමට ලක්වීමේ වැඩි සම්භාවිතාවක් සහිත රැකියාවල නියුක්තිය සියයට 71.2ක් වූ අතර 2015 වන විට එම ප්‍රතිශතය සියයට 39.6ක් දක්වා පහළ වැටී ඇත. එ වැනි ප්‍රගතියක් තිබුණත් ලොව ශ්‍රමිකයන්ගෙන් සියයට 45 (බිලියන 1.45) ක් පමණ තවමත් පහසුවෙන් අවදානමට ලක් විය හැකි රැකියාවල යෙදී සිටී. මෙම ශ්‍රමිකයන්ගෙන් අඩකටත් වඩා වැඩි සංඛ්‍යාවක් උප-සහරා අප්‍රිකාව සහ දකුණු ආසියාව නියෝජනය කරයි. මෙම කලාපවල සෑම ශ්‍රමිකයන් සිව් දෙනෙකුගෙන් ම තිදෙනෙකු (3/4) මෙ වැනි රැකියාවල නිරත වේ. ශ්‍රම වෙළෙඳපොළට ඇතුළු වන සංඛ්‍යාව ඉහළ යෑම සහ රැකියා අවස්ථා සීමා සහිත වීම නිසා 2008 සිට මෙ වැනි රැකියාවල නියුතුවන්නන්ගේ සංඛ්‍යාව මිලියන 25කින් ඉහළ ගොස් ඇත.

අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ අභිමතාර්ථය සපුරා ගැනීමෙහි ලා පිහිටුවා ඇති දෙවැනි ඉලක්කය වෙත ශ්‍රී ලංකාව කෙතෙක් දුරට ළඟා වී තිබේ ද යන්න පිළිබඳ ව විමසා බැලීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය යනාදී කරුණු පිළිබඳ ව මදක් විමසා බැලීම වැදගත් ය. ශ්‍රම බලකාය යනු ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය යි. සේවා නියුක්ත සහ සේවා වියුක්ත දෙ පිරිස ම මෙයට ඇතුළත් වේ. 2012 වසරේ ශ්‍රී ලංකාවේ වැඩ කළ හැකි වයසේ එ නම් අවුරුදු 10 සහ ඊට වැඩි මුලු ජනගහනය මිලියන 18ක් පමණ විය. එයින් ආර්ථික වශයෙන් ක්‍රියාශීලි ජනගහනය මිලියන 8.5ක් විය. ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නො වන ජනගහනය යනු වැඩකරන වයසේ ජනගහනය අතරින් රැකියාවක යෙදී නො සිටින හෝ රැකියා අපේක්ෂා නො කරන ජනගහනය යි. 2012 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි නො වූ ජනගහනය මිලියන 9.4ක් විය. එ නම් වැඩ කළ හැකි වයසේ ජනගහනයෙන් සියයට 52.8ක් ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නො වී ය. එම ජනගහනයෙන් සියයට 70.3ක් තරම් විශාල ප්‍රතිශතයක් ස්ත්‍රීන් ය. ඒ අනුව 2012 වසරේ ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය සියයට 47.2ක් වූ අතර ස්ත්‍රීන් සම්බන්ධ ව මෙම ප්‍රතිශතය සියයට 29.9ක් ද පුරුෂ පක්ෂයේ ප්‍රතිශතය සියයට 67ක් පමණ ද විය. ස්ත්‍රී පක්ෂයේ ශ්‍රම බල සහභාගිත්වයේ පහළ අගය ජනගහනයට රැකියා අනුපාතය මගින් ද නිරූපනය කෙරේ.

ජනගහනයට රැකියා අනුපාතය මගින් රැකියා අපේක්ෂිතයන්ට රැකියා සැපයීමට ආර්ථිකයට ඇති හැකියාව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ජනගහනයට රැකියා අනුපාතය පිළිබඳ විමසා බැලීමේ දී ස්ත්‍රී පුරුෂභාවය අනුවත් ප්‍රාදේශීය වශයෙනුත් එහි විෂමතා පවතින බව දක්නට ලැබේ. 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනගහනයට රැකියා අනුපාතය සියයට 50.5ක් විය. පුරුෂ ජනගහනයට රැකියා අනුපාතය සියයට 70.9 ක් වූ අතර ස්ත්‍රීන් සම්බන්ධ ව එම අනුපාතය එයින් අඩකටත් වඩා (සියයට 30.2) අඩු විය. ස්ත්‍රීන් සම්බන්ධ ව මෙම අනුපාතය පහළ අගයක් ගැනීමට ස්ත්‍රී ශ්‍රම බල සහභාගිත්ව අනුපාතය අඩු අගයක් ගැනීම හේතු වී ඇති අතර ඉහළ අධ්‍යාපන මට්ටමක් තිබියදීත් ඇතැම් ස්ත්‍රීන් විවිධ හේතු මත ශ්‍රම බලකායට එක් නොවී සිටී. එම නිසා මෙම ශ්‍රමය විවිධ අංශ ඔස්සේ ආර්ථිකය

වෙත ඇද ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු ව ඇත. එය ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තවදුරටත් පහළ හෙළීමෙහි ලා ඉවහල් වනු ඇත.

පුරුෂ පාර්ශ්වය සම්බන්ධ ව සියයට 80.2ක් වූ මෙම අනුපාතයේ ඉහළ ම අගය වාර්තා වී ඇත්තේ මොණරාගල දිස්ත්‍රික්කයෙනි. අනුරාධපුර, පොලොන්නරු, පුත්තලම, මාතලේ, මුලතිව් සහ රත්නපුර දිස්ත්‍රික්කවල එම ප්‍රතිශතය පිළිවෙළින් සියයට 77.2, 76.9, 75.6, 74.8, 74.6 සහ 74.6ක් විය. ස්ත්‍රීන් සම්බන්ධ ව සියයට 41ක් වූ ඉහළ ම අනුපාතය වාර්තා වී ඇත්තේ නුවරඑළි දිස්ත්‍රික්කයෙනි. බදුල්ල, රත්නපුර, කොළඹ, අනුරාධපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල එම ප්‍රතිශතය පිළිවෙළින් සියයට 36.2, 31.5, 30.2, 30.0 සහ 29.6ක් විය.

ජනගහනයට රැකියා අනුපාතය ඉහළ අගයක් ගත් පමණින් එය දරිද්‍රතාව පහළ වැටීමට හේතු නො වේ. උදාහරණයක් ලෙස මොණරාගල දිස්ත්‍රික්කයෙහි ජනගහනයට රැකියා අනුපාතය සියයට 80.2ක් තරම් ඉහළ අගයක් ගත්ත ද එම දිස්ත්‍රික්කයේ දරිද්‍රතා අනුපාතය සියයට 20.8ක් ව ඇත.

2012 වසරේ ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති අනුපාතය සියයට 96ක් තරම් ඉහළ අගයක් ගෙන ඇත. සේවා නියුතුවූවන්ගෙන් සියයට 40ක් පමණ ස්වයං රැකියාවල නියුතුවූවන් සහ ගෙවීමක් නො ලද පවුලේ සේවකයන් ය. ස්වයං රැකියාවල නියුතුවීම සහ පවුලේ ආර්ථිකයට උදව් කරන්නන් සම්බන්ධ ව ස්ත්‍රී පුරුෂභාවය අනුව මෙන් ම ප්‍රාදේශීය වශයෙන් ද විෂමතා පවතී. 2012 වසරේ ස්වයං රැකියාවල නියැලුනු අයගෙන් සියයට 67.4ක් නියෝජනය කරන ලදදේ පුරුෂ පක්ෂය යි. එහෙත් එම වසරේ වැටුප් නො ලබා පවුලේ ආර්ථිකයට උදව් කළ ජනගහනයෙන් සියයට 71.6ක් නියෝජනය කරන ලද්දේ ස්ත්‍රීන් විසිනි. පුරුෂ සේවා නියුක්තියෙන් සියයට 35.9ක් සහ ස්ත්‍රී සේවා නියුක්තියෙන් සියයට 23.6 ක් ස්වයං රැකියාවල නියුතුවූවන් ය. පුරුෂ සේවා නියුක්තියෙන් සියයට 3.7 ක් සහ ස්ත්‍රී සේවා නියුක්තියෙන් සියයට 19.4ක් ගෙවීමක් නො ලද පවුලේ ආර්ථිකයට උදව් කළ අය ය. මෙම අංශවල රැකියා නියුක්තියේ ප්‍රාදේශීය විෂමතා පිළිබඳ ව විමසා බැලීමේ දී මන්නාරම, පොළොන්නරුව, කිලිනොච්චිය, මොණරාගල, මුලතිව්, අනුරාධපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ස්වයං රැකියාවල නියුතුවූවන්ගේ ප්‍රතිශතය පිළිවෙළින් සියයට 50.7, 50.4, 48.6, 45.1, 43.7, 42.5 සහ 43.4 විය. කෘෂිකාර්මික සහ ධීවර අංශයේ වැඩි සේවා නියුක්තිකයන් පිරිසක් ස්වයං රැකියාවල නියුතුවූවන් එ නම් තමන්ගේ ම කටයුතුවල යෙදෙන්නන් සහ පවුලේ ආර්ථිකයට උදව් කරන්නන් ගණයට ගැනේ.

2013 වසරෙහි ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතය සියයට 4.4ක් විය. වයස් කාණ්ඩ අනුව සේවා වියුක්තිය පිළිබඳ ව විමසා බැලීමේ දී අඩුම සේවා වියුක්ති අනුපාතය වාර්තා වී ඇත්තේ අවුරුදු 40 සහ ඊට වැඩි වයස් කාණ්ඩයෙනි. 2013 වසරෙහි එම වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය සියයට 1 ක් විය. වයස අවුරුදු 15-19 වයස් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතය සියයට 18.7ක් වූ අතර අවුරුදු 20-29 වයස් කාණ්ඩයේ එම ප්‍රතිශතය සියයට 13ක් විය.

කෙසේ වෙතත් ශ්‍රමබලකායෙන් සේවා නියුක්ත ව සිටින පිරිස් පවා ඇතැම් විට දරිද්‍රතාවෙන් පෙළේ. දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ශ්‍රමිකයන් හෝ දිළිඳු ශ්‍රමික අනුපාතය මගින් එය නිරූපනය කෙරේ. 1990-1991 දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වූ ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතය සියයට 31.1ක් වූ අතර 2009-2010, 2012-2013 වර්ෂවල එම ප්‍රතිශතය පිළිවෙළින් සියයට 7.5ක් සහ 5.8ක් දක්වා පහළ වැටී ඇත. මෙම අනුපාතය සම්බන්ධයෙන් ද ප්‍රාදේශීය වශයෙන් විෂමතා දක්නට ලැබේ. 2012-2013 දිළිඳු ශ්‍රමික අනුපාතය සියයට 23.2ක් වූ ඉහළ ම ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ මුලතිව් දිස්ත්‍රික්කයෙනි. මොණරාගල, මඩකලපුව, මන්නාරම සහ බදුල්ල දිස්ත්‍රික්කවල එම ප්‍රතිශතය පිළිවෙළින් සියයට 17.6, 16.5, 14 හා 11ක් විය.

දිළිඳු ශ්‍රමික අනුපාතයේ සියයට 1.2 ක් වූ අඩුම ප්‍රතිශතය වාර්තා වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. ගම්පහ, කළුතර, වව්නියාව සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල එම ප්‍රතිශත පිළිවෙළින් සියයට 1.6, 2.5, 2.7 හා 3.7ක් විය.

2009-2010 සියයට 14.1ක් වූ යාපනය දිස්ත්‍රික්කයේ දිළිඳු ශ්‍රමික අනුපාතය 2012-2013 සියයට 8.2 දක්වා සැලකිය යුතු ලෙස පහළ වැටී ඇත. එ මෙන් ම අම්පාර දිස්ත්‍රික්කයේ දිළිඳු ශ්‍රමික අනුපාතය 2009-2010 සියයට 12.4 සිට 2012-2013 සියයට 5.2ක් දක්වා පහළ වැටී ඇත .

- **1990 - 2015 සාගින්නේ සිටින ජන සංඛ්‍යාව අඩකින් අඩුකිරීම**

අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය සපුරා ගැනීමෙහි ලා පිහිටුවා ඇති තුන්වන ඉලක්කය මෙය යි.

ශාරීරික ව දැනෙන කුසගින්න නිවීම සඳහා ප්‍රමාණවත් තරමේ ආහාර ලබාගැනීමට ඇති හැකියාව සාගින්න තුරන් කිරීම යන්නෙන් අදහස් නො කෙරේ. එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ආහාර


විහීනතාව හෝ පෝෂණ ගුණය අඩු ආහාර ලැබීම සාගින්න ලෙස දක්වයි. ඒ අනුව සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගෙවීම සඳහා අවම වශයෙන් අවශ්‍ය පෝෂණ මට්ටම නො ලැබීම සාගින්න යන්නෙන් අදහස් කෙරේ.

ලොව පුරා මිලියන 795ක පමණ ජනගහනයක් මන්දපෝෂණයෙන් පෙළේ. එයින් මිලියන 780ක පමණ විශාල ජන සංඛ්‍යාවක් වෙසෙන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල යි. කෙසේ වෙතත් 1990-1992 සිට එම රටවල සාගින්න තුරන් කිරීම සම්බන්ධ ව සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබේ. 1990-1992 සංවර්ධනය වෙමින් පවත්නා රටවල මන්ද පෝෂණයෙන් පෙළුන ජනගහන ප්‍රතිශතය සියයට 23.3ක් වූ අතර 2014-2016 එම ප්‍රතිශතය සියයට 12.9 ක් දක්වා පහළ වැටෙනු ඇතැ යි ප්‍රක්ෂේපණය කර ඇත. මෙය සහස්‍ර සංවර්ධන අභිමතාර්ථවල සාගින්න අඩු කිරීම සම්බන්ධ ඉලක්කය ජයගැනීමට ඉතාමත් ම ආසන්න තත්ත්වයකි. එහෙත් මෙහි ලා ද කලාපීය වශයෙන් විෂමතා පවතින බැව් දක්නට ලැබේ. පසුගිය දශක දෙකෙහි සිදු වූ වේගවත් ආර්ථික වර්ධනය හේතුවෙන් කොකේසස් සහ මධ්‍යම ආසියා, නැගෙනහිර ආසියා, ලතින් ඇමෙරිකා හා අග්නිදිග ආසියා කලාප සාගින්න අඩු කිරීම සම්බන්ධ ඉලක්කයට ළඟා වී ඇත. 1990 සිට සංවර්ධනය වෙමින් පවත්නා රටවල මන්දපෝෂණයෙන් පෙළෙන ජනගහනය අඩුවීමට 2/3 කින් ම දායක වී ඇත්තේ චීනය යි. සාපේක්ෂ වශයෙන් කැරිබියන්, ඕෂනියා, දකුණු ආසියාව සහ උප-සහරා අප්‍රිකාව ඉලක්කය කරා ළඟාවීමේ මන්දගාමී බවක් පෙන්වයි. දකුණු ආසියාවේ තවදුරටත් මිලියන 281ක පමණ ජනගහනයක් මන්දපෝෂණයෙන් පෙළේ.

2014-2016 උප-සහරා අප්‍රිකානු කලාපයේ මන්දපෝෂණය සියයට 23ක් වනු ඇතැ යි ප්‍රක්ෂේපණය කර ඇත. සාගින්නෙන් පෙළෙන ජන සංඛ්‍යාව පහළ වැටුණ ද කලාපයේ ඉහළ ජනගහන වර්ධනය නිරූපනය කරමින් 1990 සිට මන්දපෝෂණයෙන් පෙළෙන ජනගහනය මිලියන 44කින් ඉහළ ගොස් ඇත. එහෙත් එහි උප කලාප තුළ මන්දපෝෂණය සම්බන්ධයෙන් විශාල වශයෙන් වෙනස්කම් පවතී. උතුරු, දකුණු හා බටහිර අප්‍රිකාව දැනටමත් ඉලක්කයට ආසන්න ව සිටී. නමුත් මධ්‍යම අප්‍රිකාවේ වේගවත්

03 වැනි රූපසටහන

**සංවර්ධනය වෙමින් පවතිනා රටවල මන්දපෝෂණයෙන් පෙළුන ජනගහනය 1990-1992 සිට 2014-2016**




මූලාශ්‍රය: The Millennium Development Goals Report 2015 - United Nations

ජනගහන වර්ධනය, පරිසර ප්‍රශ්න මෙන් ම ආර්ථික හා දේශපාලන ගැටුම් හේතුවෙන් ප්‍රගතිය අඩාල ව ඇත. මෙම සියලු කලාපවලට වඩා වෙනස් මුහුණුවරක් බටහිර ආසියාව සම්බන්ධ ව දක්නට ලැබේ. ප්‍රක්ෂේපණවලට අනුව එ කී කලාපයේ 1990-1992 සහ 2014-2016 මන්දපෝෂණයෙන් පෙළෙන ජනගහන ප්‍රතිශතය සියයට 2කින් ඉහළ යනු ඇත. ඊට හේතු වනු ඇත්තේ යුද්ධ, සිවිල් අරගල හා සරණාගතයින්ගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යෑම ආදිය යි.

ඇතැම් විට මන්දපෝෂණය, ආහාර සුරක්ෂිතතාවේ සංකීර්ණ බවට හා එහි විවිධ මානයන්ට අසු නොවේ. මන්දපෝෂණය පහළ මට්ටමක පවතින හා ජනගහනයෙන් වැඩි පිරිසක් ප්‍රමාණවත් ව ආහාර ලබන තත්ත්වයක් පවතින ඇතැම් රටවල පවා බර අඩු සහ උස අඩු ළමුන් සිටින බව දක්නට ලැබේ. වයසට ගැලපෙන නියමිත බරින් යුතු නො වීම සහ නියමිත උසින් යුතු නො වීම මන්දපෝෂණයේ ලක්ෂණ ය. ඒ අනුව අවුරුදු 5 ට අඩු නියමිත බරින් යුතු නො වන ළමුන් පිළිබඳ ව විමසා බැලීමේ දී 1990-2015 අතර කාලයේ ලොව එ වැනි ළමුන් සංඛ්‍යාව අඩකින් අඩු වී ඇත. එහෙත් තවදුරටත් ලොව අවුරුදු 5 ට අඩු ළමුන් හත් දෙනෙකුගෙන් එක් අයෙකු (1/7) එ නම් මිලියන 90 කට වඩා වැඩි ළමුන් සංඛ්‍යාවක් නියමිත බරින් අඩු ය. 2015 දී අඩු බර ළමුන් ගෙන් සියයට 90ක් පමණ කලාප දෙකක් විසින් නියෝජනය කරනු ලබයි. ඒ ළමුන් සංඛ්‍යාවෙන් අඩක් දකුණු ආසියව සහ 1/3 ක් උප-සහරා අප්‍රිකාව වශයෙනි. නැගෙනහිර ආසියාව සහ ලතින් ඇමෙරිකා හා කැරිබියන් ඉලක්කයට ළඟා වී ඇත. කොකේසස් සහ මධ්‍යම ආසියාව, උතුරු අප්‍රිකාව, අග්නිදිග ආසියාව සහ බටහිර ආසියාව ද ඉලක්කයට ළඟා වී ඇත. අඩු බර ළමුන් සම්බන්ධ අහිතකර ම තත්ත්වය වාර්තා වන්නේ දකුණු ආසියාවෙනි. 2015 එම කලාපයේ ළමුන් තුන් දෙනෙකුගෙන් එක් අයෙකු (1/3) අඩු බරින් යුතු වේ. එහෙත් සියයට 22ක තරමේ විශාලත ම පහළ වැටීමක් වාර්තා වන්නේ ද මෙම කලාපයෙනි. උප-සහරා අප්‍රිකාවේ 1990 සිට අඩු බර ළමුන් සංඛ්‍යාවේ අඩුවීම 1/3කි. කෙසේ වෙතත් කලාපයේ ජනගහන වර්ධනයේ ඉහළ යෑම නිසා බරින් අඩු ළමුන් සංඛ්‍යාව ද ඉහළ අගයක් ගනී.

එ මෙන් ම ලොව අවුරුදු 5ට අඩු ළමුන් විශාල සංඛ්‍යාවක් වයසට ගැලපෙන උසින් යුත් නො වේ. 2013 වසරේ ලොව පුරා අවුරුදු 5ට අඩු ළමුන් මිලියන 161ක් නියමිත උසින් යුතු නො වීය. කෙසේ වෙතත් උප-සහරා අප්‍රිකානු කලාපයේ හැර අනෙකුත් සියලු ම කලාපවල මිටි ළමුන්ගේ සංඛ්‍යාව පහළ වැටී ඇත. එම කලාපයේ 1990-2013 එම සංඛ්‍යාව 1/3 කින් ඉහළ ගොස් ඇත.

පෝෂණ ඌනතාවට ප්‍රමාණවත් ව ආහාර නො ලැබීම ම හේතු නො වේ. සෞඛ්‍ය පහසුකම්වල මද බව, පාචනය, මැලේරියාව, එච්අයිවී/ඒඩ්ස් සහ ක්ෂය රෝගය ද එයට හේතු වේ. ලෝක ජනතාව මුහුණ දෙන දරිද්‍රතාව, විරැකියාව සහ කුසගින්න යන ගැටලු යුධ ගැටුම් හා ඒ හේතුවෙන් සිදු වන අවතැන්වීම් විසින් තවදුරටත් බරපතල ගැටලු බවට පත් කෙරෙයි. ලොව පුරා ගැටුම්, ප්‍රචණ්ඩ ක්‍රියා, මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වල ප්‍රතිඵල ලෙස 2014 වසරේ විශාල ජන සංඛ්‍යාවක් තම රට තුළ ම හෝ එයින් පිටත හෝ අවතැන් ව සිටී. එම වසරේ සෑම දිනක ම 42,000 පමණ ජන සංඛ්‍යාවකට ගැටුම් හේතුවෙන් තම නිවාස අතැර දමා රැකවරණය සොයා යෑමට සිදු ව ඇත. 2014 වසරේ අවසානය වන විට ලොව පුරා මිලියන 60 ක ජනගහනයක් අවතැන් ව සිටි අතර ඒ දෙවන ලෝක යුද්ධයට පසු වාර්තා වූ විශාලතම අවතැන්වීම් සංඛ්‍යාවයි.

ශ්‍රී ලංකාවේ සාගින්නෙන් පෙළෙන ජන සංඛ්‍යාව, එ නම් ඒක පුද්ගල දෛනික අවම ශක්ති පරිභෝජන මට්ටම වූ කිලෝ කැලරි 2030 ට වඩා අඩුවෙන් ලැබූ ජනගහන ප්‍රතිශතය 1990-1991 සියයට 51.3ක් විය. එය 2015 දී සියයට 25.6ක් දක්වා පහළ හෙළීම ඉලක්කය විය. 1990-1991 ට සාපේක්ෂ ව සාගින්නෙන් පෙළෙන ජනගහන ප්‍රතිශතය සියයට 3.1කින් පහළ වැටෙමින් 2012-2013 දී සියයට 47.8ක් විය. මේ අනුව 2013 වන විටත් සාගින්නෙන් පෙළෙන ජනගහනය අඩු කිරීමේ ඉලක්කය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන්නේ මන්දගාමී ස්වරූපයක් යැ යි හැඟේ. කෙසේ වෙතත් සාගින්න අඩු කිරීම සම්බන්ධ ව ජාතික මට්ටමින් දැකිය හැකි ප්‍රවණතාව ග්‍රාමීය හා නාගරික අංශ සම්බන්ධ ව ද දැකිය හැකි වෙතත් වතු අංශය සම්බන්ධයෙන් දක්නට ලැබෙන්නේ ඊට වෙනස් ආකාරයේ ප්‍රවණතාවකි. (3 වැනි සංඛ්‍යා සටහන). එනම් 2012-2013 වන විට වතු අංශයේ ඒක පුද්ගල දෛනික අවම ශක්ති පරිභෝජනය නො ලැබූ ජනගහන ප්‍රතිශතය සියයට 4.5කින් ඉහළ ගොස් ඇත.

කෙසේ වෙතත් අවම ශක්ති පරිභෝජනය නො ලබන ජන සංඛ්‍යාවේ ඉහළ ම ප්‍රතිශතය වාර්තා වෙන්නේ අඩු දරිද්‍රතා අනුපාතයක් වාර්තා වන නාගරික අංශයෙනි. මෙයට හේතුව නිශ්චිත ව ම පැහැදිලි නැතත් නාගරික

3 වැනි සංඛ්‍යා සටහන

**ඒක පුද්ගල දෛනික අවම ශක්ති පරිභෝජන මට්ටම නො ලැබූ ජනගහන ප්‍රතිශතය**

| | 2009 - 2010 | 2012 - 2013 |
|---|---|---|
| නාගරික | 63.8 | 62.3 |
| ග්‍රාමීය | 48.2 | 45.3 |
| වතු | 29.2 | 37.7 |
| ශ්‍රී ලංකාව | 49.5 | 47.8 |

මූලාශ්‍රය : Millennium Development Goals Country Report 2014

අංශයේ පරිභෝජන රටාවේ ස්වරූපය, එ නම් කාර්ය බහුල ජීවන රටාවක් තුළ ආහාර වේල පිළිබඳ ව එතරම් තැකීමක් නො කිරීම, බොහෝ විට නිවසින් බැහැර ස්ථානවලින් ආහාර ලබා ගැනීම ආදිය ඊට හේතු වන්නට ඇත.

අනෙක් අතට ඒක පුද්ගල දෛනික අවම ශක්ති පරිභෝජන මට්ටම නො ලැබූ ජනගහනය සම්බන්ධ ව අඩු ම ප්‍රතිශතය වාර්තා වන්නේ දරිද්‍රතා අනුපාතය වැඩි ම අගයක් ගන්නා වතු අංශයෙනි.

2009-2010 දී ජනගහනයෙන් ඉහළ ම ආදායම් ලැබූ සියයට 20න් සියයට 32.0ක් අවම ශක්ති පරිභෝජන මට්ටම නො ලැබූ අතර එම ප්‍රතිශතය 2012-2013 සියයට 33.3ක් දක්වා ඉහළ ගොස් ඇත. දුගී ම සියයට 20 ජනගහන ප්‍රතිශතය සම්බන්ධයෙන් විමසා බලන විට 2009-2010 ඒක පුද්ගල දෛනික අවම ශක්ති පරිභෝජනය මට්ටම නො ලැබූ ජනගහන ප්‍රතිශතය සියයට 74.5ක් වූ අතර 2012-2013 එම ප්‍රතිශතය සියයට 71.3ක් දක්වා පහළ වැටී ඇත.

2006 වසරේ වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගෙන් සියයට 21.1ක් වයසට නියමිත බරින් යුතු නො වී ය. එම ප්‍රතිශතය 2015 දී සියයට 14.9ක් දක්වා පහළ හෙළීම ඉලක්ක කොට ඇත. අඩු බර ළමුන් සම්බන්ධ ව මෙම ප්‍රතිශතය දිවයින පුරා ම එක ම ආකාරයෙන් ව්‍යාප්ත ව නැත. වතු අංශයේ අවුරුදු 5 ට අඩු ළමුන් සම්බන්ධයෙන් මෙම ප්‍රතිශතය සියයට 29.7ක් විය. නාගරික අංශයේ අවුරුදු 5 ට අඩු නියමිත බරින් යුත් නො වූ ළමුන් ගේ ප්‍රතිශතය සියයට 16.6ක් විය.

දිස්ත්‍රික් වශයෙන් ගත් විට අවුරුදු 5ට අඩු, නියමිත බරින් යුත් නො වූ ළමුන් පිළිබඳ සියයට 32.8ක් වූ ඉහළ ම අනුපාතය වාර්තා වී ඇත්තේ බදුල්ල දිස්ත්‍රික්කයෙනි. ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල එම ප්‍රතිශතය පිළිවෙළින් සියයට 27.8ක් හා 27.5ක් ව ඇත. සියයට 11.6ක් වූ අඩුම ප්‍රතිශතය වාර්තා වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙනි. කොළඹ දිස්ත්‍රික්කයේ එම ප්‍රතිශතය සියයට 14.1කි.

**සාරාංශය**

කලාපීය වශයෙන් විෂමතා දක්නට ලැබුණ ද සමස්තයක් වශයෙන් ගත් විට අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය ලෝකය මේ වන විට සපුරා ගෙන ඇත. 1990 වසරේ ලොව පුරා බිලියන 1.9ක පමණ ජනගහනයක් දරිද්‍රතාවෙන් පෙලුන අතර 2015 වන විට එම ජන සංඛ්‍යාව දෙගුණයකටත් වඩා වැඩි අගයකින් පහළ වැටෙමින් මිලියන 836ක් ව ඇත. 1990 දී සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනගහනයෙන් අඩකගේ පමණ ඒක පුද්ගල දෛනික ආදායම ඩොලර් 1.25ට අඩු විය. 2015 දී එම ජනගහන ප්‍රතිශතය සියයට 14ක් විය. එමෙන් ම 1990-1992 සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජනගහනයෙන් සියයට 23.3ක් වූ මන්දපෝෂණයෙන් පෙලුන ජනගහන ප්‍රතිශතය 2014-2016 සියයට 12.9ක් දක්වා පහළ වැටෙනු ඇතැයි ප්‍රක්ෂේපණය කර ඇත.

එමෙන්ම ශ්‍රී ලංකාව අන්ත දුගීභාවය සහ සාගින්න තුරන් කිරීමේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථය වසර හතකට පෙර සපුරාගෙන ඇත. එහි ලා දිගු කලක්

තිස්සේ ක්‍රියාත්මක කරන ලද සුබසාධන සහ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළවල් හේතු වී ඇත. එහෙත් ප්‍රාදේශීය වශයෙන් සහ නාගරික, ග්‍රාමීය, වතු ලෙස අංශ වශයෙන් විෂමතා පවතින බව දක්නට ලැබේ.

විෂමතා ඉවත් කොට සංවර්ධනයේ ප්‍රතිලාභ පොදුවේ බෙදී යෑමටත් දරිද්‍රතාවෙන් මිදුනු ජනගහනය යළි දරිද්‍රතාවට ඇද වැටීමේ අවදානමෙන් ගලවා ගැනීම සඳහාත් සැලසුම් සහ උපාය මාර්ග සැකසිය යුතු ව ඇත. මෙහි ලා ප්‍රවර්ධනය කළ හැකි අංශ හඳුනාගෙන ජාතික හා ප්‍රාදේශීය වශයෙන් ව්‍යාපෘති දියත් කළ යුතු ය. ප්‍රාදේශීය ව්‍යාපෘති ඒ ඒ ප්‍රදේශවල ඇති ශක්‍යතා හඳුනාගෙන එම ප්‍රදේශවලට විශේෂිත ආකාරයෙන් සැලසුම් කළ යුතු වේ. එසේ ප්‍රදේශවලට විශේෂිත ක්ෂුද්‍ර මූල්‍ය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හඳුන්වාදීම ප්‍රාදේශීය විෂමතා දුරුලීම සඳහා බෙහෙවින් ඉවහල් වනු ඇත. මෙ වැනි ව්‍යාපෘති රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දැනටත් ක්‍රියාත්මක කරයි. උතුරු පළාත ඉලක්ක කරමින් ක්‍රියාත්මක පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය සහ මොණරාගල, කුරුණෑගල, අනුරාධපුර සහ බදුල්ල දිස්ත්‍රික්ක ඉලක්ක කළ වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන - චක්‍රීය අරමුදල මෙම ව්‍යාපෘතිවලට උදාහරණ ලෙස දැක්විය හැක.

ප්‍රදේශ ඉලක්ක කළ නව ව්‍යාපෘති හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රාදේශීය නිෂ්පාදන වර්ධනය දිරිගන්වන අතර ඊට සාපේක්ෂ ව අලෙවිකරණ පහසුකම් සැපයීම ද කළ යුතු ය. මේ සඳහා නිපුණතා වර්ධනය සහ තාක්ෂණ පුහුණුව ලබාදීම ද මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට පියවර ගැනීම ද ඉතා වැදගත් වේ.

එ මෙන් ම දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල විෂමතා සහ දුර්වලතා හඳුනාගෙන ඒවා සඳහා පිළියම් යෙදිය යුතු ය. උදාහරණ වශයෙන් කුටුම්බ ආදායම් වියදම් සමීක්ෂණ දත්ත විශ්ලේෂණයේ දී ඇතැම් අවස්ථාවල සමෘධි සහනාධාර ලැබිය යුතු අඩු ආදායම්ලාභී පවුල්වලට එම සහනාධාර නො ලැබී ඉහළ ආදායම් ලබන පවුල්වලට සහනාධාර ලැබී ඇති බව හෙළි වී ඇත. මේනිසා දරිද්‍රතාවෙන් පෙළෙන කණ්ඩායම් නිසි ලෙස හඳුනාගැනීම ඉතා වැදගත් ය. එමෙන් ම සහනාධාර ලබාදීමේ දී ඒවා ලබන කණ්ඩායම් දිගු කලක් සහනාධාර මත යැපීමේ තත්ත්වයක් ඇති නො විය යුතු ය. ඒ වෙනුවට ඔවුන් දරිද්‍රතාවෙන් මිදීමට සවිබල ගන්වන ආකාරයේ සහනාධාර දීම් සහ මග පෙන්වීම් කළ යුතු වේ.

කෙසේ වෙතත් ප්‍රාදේශීය වශයෙන් මෙන් ම ජාතික මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී තුලිත ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා උපාය මාර්ග ගැනීම වැදගත් ය. එයින් අදහස් කෙරෙන්නේ සංවර්ධනය සඳහා ආර්ථිකයේ සෑම අංශයක ම දායකත්වය ලබා ගැනීමත් ඒවා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් ගොඩ නැගීමත් ය. එ නම් කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා අවශ්‍ය නවීන යන්ත්‍රෝපකරණ සහ පොහොර හා රසායන ද්‍රව්‍ය වැනි නොයෙකුත් යෙදවුම් සැපයීම සඳහා කාර්මික අංශය වර්ධනය විය යුතු ය. මෙම අංශවල විධිමත් ක්‍රියාකාරිත්වය සඳහා බැංකු හා ප්‍රවාහනය වැනි සේවා අංශය වර්ධනය විය යුතු ය. නවීකරණය විය යුතු ය. මේ නිසා ප්‍රාදේශීය අවශ්‍යතාවන්ට සහ ශක්‍යතාවන්ට ගැලපෙන ලෙස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර ම මෙම ව්‍යාපෘති තුලිත ආර්ථික සංවර්ධනයක් සඳහා ඉවහල් වන ආකාරයෙන් ක්‍රියාත්මකවීමට නම් ඒ සඳහා ආර්ථිකයේ එකිනෙක අංශ සම්බන්ධ කෙරෙන ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


1. ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණ වාර්ෂික වාර්තාව - 2012 (පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් දත්ත - ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය)
2. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2015 - ශ්‍රී ලංකා මහ බැංකුව
3. ශ්‍රී ලංකාවේ දරිද්‍රතා විමසුම 2009/2010 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය ආශ්‍රිත අධ්‍යයනය - ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
3. http://www.statistics.gov.lk/
4. Millennium Development Goals Country Report 2014 – United Nations Sri Lanka
5. The Millennium Development Goals Report 2014 - United Nations
6. The Millennium Development Goals Report 2015 - United Nations

# ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය

**ටී එම් උදයන්ති තෙන්නකෝන්**
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂිකා
ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව

### ණය කාඩ්පතක් යනු කුමක්ද?

ණය කාඩ්පතක් යනු ණය සුරැකුමක් නොමැති ව ගනුදෙනුකරුවකුට ලබා දෙන කෙටි කාලීන ණය පහසුකමක් වන අතර, එම ණය කාඩ්පත මගින් කාඩ්පත් හිමියෙකුට භාණ්ඩ හා සේවා මිලට ගැනීමේ සහ මුදල් අත්තිකාරම් ලබා ගැනීමේ පහසුකම ලැබේ.

### ණය කාඩ්පතක් භාවිතයෙන් කාඩ්පත් හිමියෙකුට අත් වන වාසි

- තමා ළඟ මුදල් නොමැති වුව ද තමාට අවශ්‍ය භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව ලැබීම
- ණය කාඩ්පතින් භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ දී මුදල් අවශ්‍ය නො වන බැවින් අතිරේක ව මුදල් ළඟ තබා ගැනීමෙන් ද තම ගිණුම්වලින් විටින් විට මුදල් ආපසු ගැනීමෙන් ද වැලකී අවසානයේ දී මුළු වටිනාකම පියවීමට කටයුතු කිරීමෙන් ගිණුමේ ඇති මුදලට පොළියක් ලැබීම
- මුදල් එහා මෙහා රැගෙන යාමේ අවශ්‍යතාව අවම වීම
- මුදලින් ගනුදෙනු කිරීමේ දී මෙන් ඉතිරි මුදල් ලබාගැනීමේදී ගැටලු ඇති නො වීම
- ණය කාඩ්පතින් ගෙවීමේ දී මුදල් වට්ටම්, ප්‍රසාද ලකුණු ආදිය ලැබීම

### ණය කාඩ්පතක් ලබාගැනීමේ දී සැලකිය යුතු මූලික කරුණු

- කාඩ්පත් නිකුත් කරන්නා, ණය කාඩ්පත් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා තිබීම
- නිකුත් කරන්නා විසින් සඳහන් කර ඇති;
  - කාඩ්පත ලබාගැනීමේ ගාස්තුව
  - වාර්ෂික ගාස්තුව
  - මාසික ව මුළු මුදල නො ගෙවුවහොත් ඊට අය කරන පොළිය හා අදාළ පොළිය ගණනය කරන ආකාරය
  - ගෙවීම් නියමිත දිනට සිදු නොකළ විට අදාළ වන ප්‍රමාද ගාස්තුව
  - තමාට හිමි ණය සීමාව
  - අත්තිකාරම් සඳහා අය කරන පොළිය හා එය ගණනය කරන ආකාරය
  - ණය කාඩ්පත් සඳහා විවිධ මුදල් වට්ටම් ප්‍රසාද ලකුණු ලැබීමේ දී ඇති කොන්දේසි පිළිබඳ දැනුම්වත් ව සිටීම

- ණය කාඩ්පත් ලබා ගැනීමේ එකඟතා ගිවිසුම අත්සන් කිරීමට පෙර කාඩ්පතට අදාළ නියමයන් හා කොන්දේසි හොඳින් කියවා අවබෝධ කර ගැනීම සහ අපැහැදිලි කරුණු ඇත්නම් ඒවා පැහැදිලි කරගැනීම
- කාඩ්පත් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු දැනුම් දීම සඳහා කාඩ්පත් නිකුත් කරන්නාගේ අදාළ දුරකතන අංක ලබා ගැනීම

## ණය කාඩ්පත භාවිතා කිරීමේ දී සැලකිය යුතු මූලික කරුණු



- ලබාගත් ණය කාඩ් පත සුරක්ෂිත ව තබා ගැනීම හා යම් හෙයකින් එය නැති වුවහොත් නිකුත් කළ ආයතනයට වහා ම දැනුම් දීම
- ණය කාඩ්පතක් භාවිතා කර යම් ගනුදෙනුවක් සිදු කළ විට එම තොරතුරු කාඩ්පත් හිමියාට දැනුම්දීම සඳහා ලබාදෙන කෙටි පණිවුඩ (SMS) පහසුකම ලබාගැනීම සහ ගනුදෙනු සම්බන්ධයෙන් තමාට ලැබෙන කෙටි පණිවුඩ පිළිබඳ අවධානයෙන් සිටීම
- යම් හෙයකින් තමා නො කළ ගනුදෙනුවක් පිළිබඳ තොරතුරු ලැබුණහොත් අදාළ තොරතුරු කාඩ්පත නිකුත් කළ ආයතනයට වහාම දැනුම් දීම
- ණය කාඩ්පත් ගනුදෙනු සඳහා අය කරන පොළී හා ප්‍රමාද ගාස්තුවලින් වැළකීම සඳහා මාසික ප්‍රකාශනයේ දැක්වෙන පරිදි ගෙවිය යුතු මුළු මුදල සම්පූර්ණයෙන් ම නියමිත දිනට හෝ ඊට පෙර ගෙවා දැමීම
- අදාළ දිනයට මුදල සම්පූර්ණයෙන් නො ගෙවා, නියම කර ඇති අවම මුදල (හෝ ඊට වැඩි අගයක්) පමණක් ගෙවුවහොත් භාවිතා කළ ණය පහසුකම සඳහා පොළියක් ද, අවම මුදල නොගෙවුවහොත් පොළියට අමතර ව ප්‍රමාද ගාස්තුවලට ද යටත් වීමට සිදු වනු ඇත.
- ණය කාඩ්පත නිසි මූල්‍ය විනයකින් තොර ව භාවිතා කළහොත් ණය උගුලකට හසුවීමට ඉඩ ඇති බව හා ණය නො ගෙවා සිටියහොත් තම නම ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ (Credit Information Bureau of Sri Lanka - CRIB) ණය පැහැර හරින්නන්ගේ වාර්තාවලට ඇතුළත් වීමෙන් අනාගතයේ දී ණය ලබා ගැනීමට යෑමේ දී අයහපත් ලෙස බලපෑ හැකි බවත් අමතක නොකළ යුතු කරුණු වේ.

## ණය කාඩ්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු විසින් 1989 වර්ෂයේ දී ණය කාඩ්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලද අතර, ගෙවීම් මාධ්‍යයක් ලෙස ජනප්‍රිය වෙමින් පැවති ණය කාඩ්පත්, කර්මාන්තයක් ලෙස 2009 වන තුරු නියාමනය කිරීමක් සිදු නො වී ය. නියාමනය නො කරන ලද ගෙවීම් කාඩ්පත් කර්මාන්තයෙහි ඇති අවදානම් සහ එයින් මූල්‍ය පද්ධති ස්ථායිතාව කෙරෙහි ඇති විය හැකි ඍණාත්මක බලපෑම් මෙන් ම රටෙහි ගෙවීම් කාඩ්පත් කර්මාන්තය ප්‍රමිතිකරණය කිරීමෙහි වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ජාත්‍යන්තර පරිචයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූල ව යමින්, 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නන් සඳහා වූ 2009 අංක 1 දරන නියෝගය නිකුත් කරන ලද අතර, පසු ව මෙම නියෝගය 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත්

හා ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝගය මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම නියෝග මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නන් නියාමනය කිරීමට අවශ්‍ය බලතල ලබා දී ඇත.

මෙම නියෝගවලට අනුව, රට තුළ ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයේ නියැලීමට අපේක්ෂිත සෑම සේවා සපයන්නෙකු ම විසින් ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයේ නියැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු වේ. ඉහත නියෝග යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුරක්ෂිත සහ කාර්යක්ෂම ණය කාඩ්පත් ව්‍යාපාරයක් ඇති කිරීමත්, ණය කාඩ්පත් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත් අරමුණු කරගනිමින්, 2010 අංක 01 දරන ණය කාඩ්පත් මෙහෙයුම් උපදෙස් මාලාව නිකුත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව 2011 දී, ශ්‍රී ලංකා ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරික සංගමය විසින් ණය කාඩ්පත් නිකුත් කරන්නන් සඳහා චර්යාධර්ම මාලාවක් නිකුත් කරන ලදී.

2014 වසර අවසන් වන විට, ණය කාඩ්පත් නිකුත් කිරීම සඳහා බලපත්‍ර ලත් ආයතන ගණන 14ක් විය. 2014 වර්ෂය අවසානයේ දී භාවිතයේ තිබූ මුළු ණය කාඩ්පත් සංඛ්‍යාව 1,032,833 ක් වූ අතර, එ මගින් වටිනාකම රුපියල් මිලියන 134,580 ක් වන ගනුදෙනු 23,631,921 ක් සිදු කර ඇත.

සුරක්ෂිත ණය කාඩ්පත් කර්මාන්තයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යමින් සමස්ත ආර්ථිකයට ම එමගින් වාසි අත්කර දීම සඳහා ණය කාඩ්පත් හිමියන් මෙන් ම ණය කාඩ්පත් සේවා සපයන්නන් ද වගකීමෙන් මෙන් ම අවබෝධයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. ■

## ණය කාඩ්පත් මෙහෙයුම් මාර්ගෝපදේශ

### 1. මාර්ගෝපදේශ හඳුන්වා දීම

කාඩ්පත් භාවිතය මගින් භාණ්ඩ හා සේවා මිළදී ගැනීම සහ/හෝ මුදල් ලබාගැනීම පසුගිය වසර කිහිපය තුළදී, සැලකිය යුතු ලෙස වැඩි වූ අතර එයට ප්‍රධාන හේතුවක් වූයේ එදිනෙදා ගනුදෙනු පියවාගැනීම සඳහා ණය කාඩ්පත් භාවිතයට මහජනතාවගේ ඇති කැමැත්ත වර්ධනය වීමයි. ගනුදෙනුකරුට ඇති පහසුවත්, ගනුදෙනුවේ ඇති ආරක්ෂාකාරී බවත් මෙම වර්ධනය ඇති වීමට බලපා ඇත. විද්‍යුත් අලෙවි කවුළු ප්‍රමාණය වර්ධනය වීම, ණය කාඩ්පත් නිකුත් කරන්නන් ණය කාඩ්පත් භාවිතය ඉහළ නැංවීම සඳහා පිරිනමනු ලබන ත්‍යාග ක්‍රම සහ දිරිගැන්වීම් මෙම ඉහළ වර්ධනයට තවදුරටත් සාක්ෂි දරයි.

ගෙවීම් සහ පියවීම් පද්ධතියෙහි ආරක්ෂාකාරී බව, කාර්යක්ෂම බව, තරගකාරී බව සහ ස්ථායීතාව සහතික කිරීම සඳහා ජාතික ගෙවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමටත්, ගෙවීම් සහ පියවීම් පද්ධති අවේක්ෂණ කටයුතු කිරීමටත් අවශ්‍යවන නීතිමය බලතල, 2005 අංක 28 දරණ ගෙවීම් සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත. විද්‍යුත් ගෙවීම් ක්‍රම වැඩි දියුණු කිරීම මෙන්ම පාරිභෝගික ආරක්ෂාව සහතික කිරීම සඳහා වන කාලීන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2009 ජූලි 31 වන දින සිට බලපැවැත්වෙන පරිදි 2009 අංක 1 දරණ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ රෙගුලාසි නිකුත් කරන ලදී. ගෙවීම් මාධ්‍යයක් ලෙස ණය කාඩ්පත් භාවිතා කිරීමේ දී ආරක්ෂිත, විශ්වසනීය සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය කාඩ්පත් මෙහෙයුම් සඳහා වූ පහත සඳහන් මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

ඉහත සඳහන් රෙගුලාසි පදනම් කරගෙන සකස් කරන ලද ණය කාඩ්පත් සඳහා වූ මෙම මෙහෙයුම් මාර්ගෝපදේශ, 2010 මාර්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ණය කාඩ්පත් ව්‍යාපාරයෙහි නියුතු සියළුම සේවා සැපයුම්කරුවන්හට අදාළ වනු ඇත.

මෙම මාර්ගෝපදේශවල සඳහන් වන ඒක වචන, බහු වචන සඳහා ද බහු වචන, ඒක වචන සඳහා ද වලංගු අතර පුරුෂ ලිංග වචන ස්ත්‍රී ලිංග වචන සඳහා ද අදාළ වේ.

## 2. ණය කාඩ්පත් අලෙවිකරණය

ණය කාඩ්පත් නිකුත් කිරීම මගින් කාඩ්පත් ලාභියෙකු (මෙහි මින් මතු "ගනුදෙනුකරු" ලෙස සඳහන් කරනු ලබන) සමඟ ගිවිසුම්ගත සම්බන්ධතාවයක් ගොඩනගා ගන්නා කාඩ්පත් නිකුත් කරන ආයතන (මෙහි මින් මතු "කාඩ්පත් නිකුත්කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් තම ණය කාඩ්පත් මෙහෙයුම් සඳහා වෙළෙඳපොළ උපාය මාර්ග සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

2.1 අපේක්ෂිත හෝ වර්තමාන ගනුදෙනුකරුවන් සඳහා කාඩ්පත් ප්‍රවර්ධන ක්‍රියාවලියෙහි නිරත වීමට පෙර හෝ ඒ අතරතුර දී අලෙවිකරණ කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ගේ නිල හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතුය.

2.2 කාඩ්පත් නිකුත්කරන්නා විසින් ඕනෑම ණය කාඩ්පත් අලෙවි ප්‍රවර්ධන ක්‍රියාවලියක දී හෝ ණය කාඩ්පත් මෙහෙයුම් හා සම්බන්ධ වෙනත් කවර අවස්ථාවක දී හෝ ගනුදෙනුකරුවන් හට ප්‍රතිලාභ, දිරිගැන්වීම් සහ තෑගි ලබාදෙන විටදී මෙන්ම අයකිරීම් හෝ ගාස්තු අඩු කිරීමක් සිදුකරන විට දී ද ඒ සියල්ල ලියවිල්ලක් මගින් (විද්‍යුත් හෝ මුද්‍රිත ආකාරයෙන්) පැහැදිලිව ගනුදෙනුකරු වෙත දැන්විය යුතු වේ.

2.3 ණය කාඩ්පත් හා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි ගනුදෙනුකරුට පැහැදිලිව ප්‍රකාශ කළ යුතු අතර, එම තොරතුරු ඉල්ලා සිටින අවස්ථාවක දී ඔවුන් වඩාත් කැමති භාෂා මාධ්‍යයකින් ලිඛිතව ඒවා ලබාදිය යුතුය. තවද කාඩ්පත් නිකුත්කරන්නන් විසින් මෙම නියමයන් සහ කොන්දේසි ඔවුන්ගේ වෙබ් අඩවිවල ප්‍රදර්ශනය කළ යුතුය.

2.4 කාඩ්පත් නිකුත්කරන්නන් විසින් ණය කාඩ්පත් මෙහෙයුම් සම්බන්ධ ඔවුන්ගේ චර්යාධර්ම/ආයතනික ප්‍රතිපත්තිය අලෙවිකරණ ක්‍රියාවලියේ දී අනාවරණය කළ යුතු අතර, එම චර්යාධර්ම/ආයතනික ප්‍රතිපත්තිය නිල වෙබ් අඩවිවල ප්‍රදර්ශනය කළ යුතුය.

2.5 කාඩ්පත් නිකුත් කරන ආයතනයන්හි අලෙවිකරණ කාර්ය මණ්ඩලය ගනුදෙනුකරුවන්ට ණය කාඩ්පතෙහි විශේෂාංග/හිමිවන ප්‍රතිලාභ මෙන්ම අවාසි පිළිබඳව ද සම්පූර්ණ විස්තරයක් ලබාදිය යුතු අතර, කාඩ්පත් නිකුත්කරන්නා විසින් එසේ ලබා නොදෙන කුමන හෝ විශේෂාංගයක්/ප්‍රතිලාභයක් පිළිබඳව අසත්‍ය තොරතුරු ප්‍රකාශ කිරීම නොකළ යුතුය.

2.6 නොමඟ යවන සුළු හෝ ආචාරධර්මයන්ට පටහැනි තොරතුරු/දැන්වීම් ඉදිරිපත් කිරීම හෝ ප්‍රසිද්ධ කිරීම නොකළ යුතුය.

2.7 කාඩ්පත් නිකුත්කරන්නන් විසින් කලින් වෙන්කරවා ගන්නා ලද වේලාවන්වලදී හැර, ගනුදෙනුකරුවන්ට අපහසු වේලාවන්වලදී/කාර්යාල වේලාවන් තුළදී, ආක්‍රමණශීලී ආකාරයෙන් අලෙවිකරණ කටයුතුවල නොයෙදිය යුතුය.

2.8 කාඩ්පත් නිකුත්කරන්නන් විසින් ඔවුන්ගේ අලෙවිකරණ කාර්ය මණ්ඩල සඳහා විධිමත් පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විය යුතු අතර එම වැඩමුළු තුළින් ගනුදෙනුකරුවන්ගෙන් අයකරන ගාස්තු, ආරක්ෂාකාරී ක්‍රියා පිළිවෙත්, ආරවුල්/පැමිණිලි විසඳුම් ක්‍රියාවලිය ආදී තොරතුරු ඇතුළත්ව ණය කාඩ්පත් මෙහෙයුම් හා සම්බන්ධ සියළු අංශයන් පිළිබඳව අවබෝධයක් ලබා දිය යුතුය.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2010



# ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික සංවර්ධනයට ශක්තියක් වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල කාර්යභාරය

**ඩී. එම්. ඩී. බී. දිසානායක**
ප්‍රාදේශීය කළමනාකරු
මාතලේ ප්‍රාදේශීය කාර්යාලය

**පසුබිම**

නිදහසින් පසු ගත වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිසරය බොහෝ සෙයින් වෙනස් වී ඇත. මේ කාලය තුළ ජනතාව විසින් පත් කරගත් සෑම රජයක් ම ශ්‍රී ලංකාවේ ජනතාව ආර්ථික හා සමාජීය වශයෙන් ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා විශාල මුදලක් ආයෝජනය කරමින් රටේ යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනයට කටයුතු කොට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ මහාමාර්ග, වාරි මාර්ග, විදුලි බලය, සන්නිවේදන පහසුකම්, සෞඛ්‍ය හා අධ්‍යාපනය, ගොඩබිම්, ගුවන් හා නාවික ප්‍රවාහනය ඇතුළු විවිධ අංශ ඉතා ඉහළ මට්ටමකින් සංවර්ධනය වී ඇත. ඒ අනුව රට ආර්ථික හා සමාජමය වශයෙන් ඉහළ මට්ටමේ සංවර්ධනයක් අත්කර ගෙන ඇති බව පොදු පිළිගැනීම යි. ඒ බව ජාත්‍යන්තර වශයෙන් ද පිළිගනිමින් මානව සංවර්ධනය දර්ශකය (Human Development Index - HDI), ව්‍යාපාර පවත්වාගැනීම පිළිබඳ දර්ශකය (Doing Business Index - DBI), ලෝක සෞභාග්‍ය දර්ශකය (Global Prosperity Index) හා ලෝක තරගකාරිත්ව දර්ශකය (Global Competitiveness Index) ඇතුළු ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර දර්ශක කිහිපයකට අනුව ශ්‍රී ලංකාවට දකුණු ආසියානු කලාපයේ ඉහළ ම ස්ථානය හිමි වී ඇත.

මෙ සේ යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනයට විශේෂ අවධානය යොමු කිරීමෙන් රජය බලාපොරොත්තු වන්නේ මෙකී සංවර්ධනයේ ප්‍රතිලාභ රටේ සෑම පළාතකට ම මෙන් ම සෑම පුද්ගලයෙකුට ම අත්කර දීම යි. කෙසේ වුව ද දළ ජාතික නිෂ්පාදිතය, කර්මාන්ත හා දිළිඳුකම පිළිබඳ මෑත කාලීන සමාජ ආර්ථික දත්ත පරීක්ෂා කිරීමේ දී ආර්ථික හා සමාජ සංවර්ධනයේ ප්‍රදේශීය වශයෙන් අසමතුලිතා පවතින බවටත් ආදායම බෙදී යෑමේ විෂමතා ඇති බවටත් එම සංඛ්‍යා දත්ත සාක්ෂි දරයි (1- 3 සංඛ්‍යා සටහන්)ග

1 වැනි සංඛ්‍යා සටහන

**දළ ජාතික නිෂ්පාදිතයට ප්‍රාදේශීය දායකත්වය**

| පළාත (%) | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 51.4 | 50.8 | 50.1 | 46.5 | 45.4 | 45.1 | 44.8 | 44.4 | 43.4 | 42.0 |
| දකුණ | 8.9 | 8.9 | 10.0 | 10.5 | 10.6 | 10.2 | 10.7 | 11.1 | 11.5 | 11.0 |
| වයඹ | 8.5 | 8.9 | 9.1 | 9.9 | 10.0 | 10.3 | 9.4 | 10.0 | 9.6 | 10.2 |
| මධ්‍යම | 9.2 | 8.5 | 8.8 | 9.6 | 9.9 | 9.6 | 10 | 9.8 | 9.8 | 11.1 |
| සබරගමුව | 6.4 | 6.4 | 6.1 | 6.4 | 6.4 | 6.3 | 6.3 | 6.2 | 6.2 | 6.1 |
| නැගෙනහිර | 4.9 | 4.7 | 4.9 | 5.2 | 5.5 | 5.8 | 5.9 | 5.7 | 6.3 | 6.3 |
| උතුරු මැද | 3.6 | 4.3 | 4.0 | 4.0 | 4.7 | 4.8 | 4.8 | 4.6 | 4.7 | 5.1 |
| ඌව | 4.3 | 4.5 | 4.3 | 4.9 | 4.6 | 4.6 | 4.5 | 4.5 | 4.5 | 4.6 |
| උතුර | 2.9 | 3.0 | 2.8 | 2.9 | 2.9 | 3.3 | 3.4 | 3.7 | 4.0 | 3.6 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

2 වැනි සංඛ්‍යා සටහන

**කර්මාන්ත ස්ථානගත වීම - 2013**

| බස්නාහිර | වයඹ | මධ්‍යම | දකුණ | සබරගමුව | නැගෙනහිර | උතුරු මැද | උතුර | ඌව |
|---|---|---|---|---|---|---|---|---|
| 41% | 19% | 12% | 9% | 8% | 4% | 4% | 2% | 2% |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

මෙම තත්ත්වය ආර්ථික හා සමාජ ගැටලු රාශියකට හේතු වන බැවින් සංවර්ධනයේ ප්‍රාදේශීය අසමතුලිතතා සහ ආදායම බෙදී යෑමේ විෂමතා අවම කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක අවශ්‍යතාව මතු ව ඇත.

යටිතල පහසුකම් ඇතුළු විවිධ සංවර්ධන කටයුතු සඳහා රජය විසින් වැය කරනු ලබන මුදල් ක්‍රමයෙන් පහළ මට්ටමේ ආදායම් ලබන ජනතාව වෙත ගලා යනු ඇතැයි අපේක්ෂා කළත් එය බලාපොරොත්තු වන වේගයෙන් ඒ ආකාරයට ම සිදු නො වේ. යටිතල පහසුකම් ඇතුළු විවිධ සංවර්ධන කටයුතු සඳහා රජය වැය කරන මුදල් සමාජයේ විවිධ මට්ටමේ ජන කොටස් වෙත රැඳීම නිසා දිළිඳු කොටස් වෙත කාන්දු වන ප්‍රමාණය ඉතා සීමිත ය. එ මෙන් ම එම ප්‍රමාණය ද දිළිඳු ජන කොටස් අතට පත්වීමට බොහෝ විට සෑහෙන කාලයක් ගත වේ. එ නිසා ම ආදායම බෙදී යෑමේ විෂමතාව රටේ සමස්ත ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපාමින් තවදුරටත් වර්ධනය වෙමින් පවතී.

යටිතල පහසුකම් සඳහා රජය වැයකරන මුදල් භූමිය, ශ්‍රමය, බදු කුලී හා ලාභ ලෙස නිෂ්පාදකයන් අතට පත් වේ. ඒ අනුව මෙම මුදලින් වැඩි කොටසක් ජනගහන පිරමීඩයේ ඉහළින් ම සිටින පොහොසතුන් වෙත ද සැලකිය යුතු කොටසක් මධ්‍යම පන්තිය වෙත ද ඉතා සුළු කොටසක් පිරමීඩයේ පහළ ම සිටින දුප්පතුන් වෙත ද ගලා යෑම සාමාන්‍ය තත්ත්වය යි. මෙම තත්ත්වය දුරලා ජනගහන පිරමීඩයේ ඉහළ කොටස්වල සිටින අය අතට පත් වන මුදල් එම පිරමීඩයේ පහළ මට්ටමේ සිටින පිරිසගේ අතට පත් කිරීම සඳහා නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරමින් රටේ ජනතාව වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනයට පෙළඹවීම සඳහා වන වැඩපිළිවෙලක් ද රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පිරමීඩයේ ඉහළ මට්ටම්වල සිටින පිරිස් පහළ මට්ටමේ සිටින පිරිස් නිපදවන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම නිසා ඔවුන් අතැති මුදල් ක්‍රමයෙන් පහළ මට්ටම්වල සිටින පිරිස වෙත ගලා එයි. එ මගින් පහළ මට්ටම්වල සිටින පිරිසේ ආදායම ක්‍රමයෙන් ඉහළ යන අතර මේ නිසා රටේ දිළිඳුකම අඩු වේ.

3 වැනි සංඛ්‍යා සටහන


**දිළිඳුකම - 2010**

| බස්නාහිර | වයඹ | මධ්‍යම | දකුණ | සබරගමුව | නැගෙනහිර | උතුරු මැද | උතුර | ඌව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4.2 | 11.3 | 9.7 | 9.8 | 10.6 | 14.8 | 5.7 | 12.8 | 13.7 | 8.9 |

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

1 වැනි රූප සටහන

**ආයෝජන ආදායම් පහළ ස්ථර වෙත ගලා යෑම**




**නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම**

ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ ප්‍රාදේශීය අසමතුලිතතාව සහ ආදායම බෙදී යෑමේ විෂමතාව දුරලමින් රට ආර්ථික හා සමාජීය වශයෙන් සංවර්ධනය කිරීම සඳහා රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සැපයීම පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් සමන්විත යාන්ත්‍රණයක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ආයතනවල වගකීම වන්නේ රටේ නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා කාර්යක්ෂම ව සැපයීමයි. රජය එක් පසකින් දිවයින පුරා විවිධ යටිතල පහසුකම් සංවර්ධනය කරන අතර ම අනෙක් පසින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සැපයීම පිණිස රාජ්‍ය හා පුද්ගලික අංශයේ ආයතනවලින් සමන්විත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරයි.

මෙහි දී දිළිඳු ජනකොටස්වල ආදායම් වර්ධනය කොට ඔවුන් ගේ ආර්ථික තත්ත්වය ඉහළ දැමීම සඳහා ඔවුන් ආර්ථික ක්‍රියාවලියට සෘජු ලෙස දායක කරගත යුතු වේ. මේ සඳහා ඔවුන් විවිධ ආදායම් උත්පාදන මාර්ගවලට (Income Generating Activities - IGAs) යොමු කරමින් වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොමු කළ යුතු ය.

ප්‍රාදේශීය මට්ටමෙන් දියුණු වන යටිතල පහසුකම්වල සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් සමන්විත යාන්ත්‍රණයේ සහාය තුළින් වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් හෙවත් ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය හා මහා පරිමාණ නිෂ්පාදකයින් හට නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන කර්මාන්ත ආරම්භ කිරීමටත් පවත්නා කර්මාන්ත වැඩිදියුණු කර ගැනීමටත් අවස්ථාව සැලසේ. මේ සඳහා අත්‍යවශ්‍ය කරුණක් වනුයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවලින් සමන්විත යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව යි. එම ආයතනවල ප්‍රතිපත්තිය විය යුත්තේ වෙළෙඳපොළ සඳහා වගා කරන ගොවියා හෙවත් කෘෂි ව්‍යාපාරිකයාට හා කර්මාන්තකරුවාට තම උපරිම අවධානය තම කෘෂි ව්‍යාපාරයට හා කර්මාන්තයට යෙදවිය හැකි පරිදි ඔවුන්ගේ උපරිම කාලය ගොවිපළේ හා කර්මාන්ත ශාලාවේ ගත කිරීමට හැකි වන පරිදි ඔවුන් වෙත කාර්යක්ෂම සේවයක් සැලසීම යි. එ විට ඔවුන් හට නිදහසේ තම කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සාර්ථක ව පවත්වා ගෙන යා හැකි වනු ඇත.

2 වැනි රූප සටහන




**මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සැපයීම හෙවත් සංවර්ධනයේ ඒකාබද්ධ ප්‍රවේශය**

රටක සංවර්ධනයේ යාන්ත්‍රණය (Engine of Growth) හෙවත් පදනම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර බව වර්තමාන ලොව සීඝ්‍රයෙන් සංවර්ධනය වූ රටවල් අපට උගන්වන පාඩම යි. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නයේ අත්‍යවශ්‍ය සාධකයක් වන ආර්ථික සංවර්ධන ඉලක්ක අත්කර ගැනීමේ දී ප්‍රාදේශීය අසමතුලිතතාව සහ ආදායම බෙදී යෑමේ විෂමතාව අවම කිරීම පිණිස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හා කෘෂි ව්‍යාපාරිකයින් දිරිගන්වන සුළු පරිසරයක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වනු ඇත. මේ සඳහා නව කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමත් පවතින කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර වැඩිදියුණු කිරීමත් පිණිස අවශ්‍ය සහාය ලබාදීමේ ඒකාබද්ධ ප්‍රවේශයක් (Integrated Approach) හෙවත් "මහා තල්ලුවක්" (Big Push) එම අංශයේ කර්මාන්ත හා ව්‍යාපාර සඳහා ලබා දීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ප්‍රධාන අංශ 4ක් යටතේ මතු දැක්වෙන මූල්‍ය හා මූල්‍ය නො වන සේවා ලබා දිය යුතු වේ.

i. මූල්‍ය සහාය (Financial Assistance)
ii. පුහුණුව හා මානව සම්පත් සංවර්ධන සහාය (Training & Human Resource Development Assistance)
iii. තාක්ෂණික සහාය (Technical Assistance)
iv. අලෙවි සහාය (Marketing Assistance)

මෙම ඒකාබද්ධ ප්‍රවේශය මුල්කරගත් මූල්‍ය හා මූල්‍ය නො වන සේවා ලබා දීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණය දැනටමත් දිවයිනේ ස්ථාපිත කොට ඇති අතර එම යාන්ත්‍රණය ක්‍රමවත් ව, කාර්යක්ෂම ව සහ මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක කළ යුතු ව ඇත.

මේ වගකීම සාර්ථක කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ම ප්‍රාදේශීය කාර්යාල ක්‍රමවත් සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල එම බල ප්‍රදේශවල සංවර්ධනයේ කේන්ද්‍රස්ථාන බවට පත් වෙමින් ප්‍රාදේශීය සංවර්ධනයේ නියමුවන් ලෙස කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සපයන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නො වන ආයතන සම්බන්ධීකරණය කරමින් එම

සහායක සේවා කාර්යක්ෂම ව සැපයීම සඳහා වන ක්‍රියාශීලී කාර්යභාරයක නියැලී සිටී.

**ප්‍රාදේශීය සංවර්ධනයේ දී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යභාරය**

ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයේ පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගනිමින් විවිධ කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවතින කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර වැඩි දියුණු කිරීමට අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සැපයීම හා එ වැනි සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නො වන ආයතන සම්බන්ධීකරණය කරමින් අදාළ සේවා නියමිත වේලාවට අවශ්‍ය පරිදි කාර්යක්ෂම ව ලබා දීමට මැදිහත් වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්මේන්තුව ඇතුළු විවිධ දෙපාර්මේන්තු විසින් පවත්වනු ලබන විවිධ සමීක්ෂණ සඳහා ප්‍රාදේශීය මට්ටමෙන් අවශ්‍ය සහාය ලබා දීම සහ සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ සේව්‍ය හා සේවක පක්ෂ වෙත විවිධ සේවා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් සිදුකිරීම ප්‍රාදේශීය කාර්යාලවල මූලික කාර්ය යි. ඒ අනුව කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සඳහා අවශ්‍ය මූල්‍ය හා මූල්‍ය නො වන සේවා සම්පාදනයේ දී ප්‍රාදේශීය කාර්යාල පහත පරිදි මැදිහත් වේ.

**මූල්‍ය සහාය (Financial Assistance)**

වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සඳහා අවශ්‍ය මූල්‍ය සේවා සම්පාදනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල විසින් සිය බල ප්‍රදේශවල මූල්‍ය අංශයේ බැංකු හා බැංකු නො වන මූල්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් පහත පරිදි මූල්‍ය සහායක සේවා සපයනු ලැබේ.

i. **අවිධිමත් මූල්‍ය අංශයෙන් විධිමත් මූල්‍ය අංශයට ව්‍යාවසායකයින් යොමු කිරීම හා ඔවුන් ඇතුළු විවිධ අංශවලට අයත් පුද්ගලයින්ගේ මූල්‍ය සාක්ෂරතාව (Financial Literacy) වර්ධනය කිරීමේ හා බල ප්‍රදේශයේ මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusiveness) වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම:**

   දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශවල මෙන් ම නාගරික ප්‍රදේශවල ද අවිධිමත් මූල්‍ය අංශය සමග මූල්‍ය ගනුදෙනුවල නිරත වන පිරිස් සිටී. එවැනි මූල්‍ය ගනුදෙනු සිදුකොට විවිධ අපහසුතාවන්ට ලක්වූවන් පිළිබඳ ව විවිධ මාධ්‍යවල පළවන ප්‍රවෘත්ති හා වාර්තා සාක්ෂි දරයි. මෙම තත්ත්වය කාර්යක්ෂම මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යෑමට මෙන් ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට ද බාධාවක් වේ. එ බැවින් විවිධ අංශවල හා විවිධ ආදායම් මට්ටම්වල ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව හා සමස්තයක් ලෙස ප්‍රාදේශීය කාර්යාලයීය බල ප්‍රදේශ තුළ මූල්‍ය අන්තර්ගතභාවය වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීමට ප්‍රාදේශීය කාර්යාල කටයුතු කරනු ලැබේ.

ii. **මූල්‍ය, ප්‍රාග්ධන හා කොටස් වෙළෙඳපොළ ආයෝජනය තුළින් ප්‍රාග්ධන සම්පාදනයට පෙළඹවීම:**

   ඕනෑම රටක හෝ ආයතනයක හෝ පුද්ගලයෙකුගේ හෝ ආර්ථික සංවර්ධනයේ දී ප්‍රාග්ධන සම්පාදනය අත්‍යවශ්‍ය සාධකයකි. මෙහිදී ජනතාවගේ ඉතිරි කිරීමේ නැමියාව ප්‍රවර්ධනය හා එම අරමුදල් විචක්ෂණශීලී ව ආයෝජනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව ප්‍රාදේශීය කාර්යාලය විසින් ව්‍යවසායකයින් ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයීය බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාවගේ ඉතිරිකිරීමේ නැමියාව ප්‍රවර්ධනය කිරීමේ සහ ඔවුන්ගේ අතිරික්ත මුදල් විචක්ෂණශීලී ව ආයෝජනය කරන ආකාරය පිළිබඳ ව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ප්‍රදේශයේ බැංකු හා බැංකු නො වන මූල්‍ය ආයතන ඇතුළු විවිධ රාජ්‍ය හා රාජ්‍ය නො වන ආයතන හා එක් ව සංවිධානය කරනු ලැබේ.

iii. **ශ්‍රී ලංකා මහ බැංකුව හා වෙනත් බැංකු විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ණය යෝජනා ක්‍රම යටතේ සංවර්ධන ණය ලබාදීම:**

   කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සඳහා ආයෝජනය දිරිමත් කිරීමේ අරමුණෙන් විවිධ සහනශීලී කොන්දේසි හා ප්‍රතිපත්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ වාණිජ හා සංවර්ධන බැංකු විසින් විවිධ සංවර්ධන ණය යෝජනා ක්‍රම රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේවා පිළිබඳ ව ව්‍යවසායකයින් ඇතුළු පොදු ජනතාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම සහ ව්‍යවසායකයින් සඳහා “ණය කඳවුරු” (Credit Camps) හා “බැංකු සායන” (Bank Clinics) පැවැත්වීම තුළින් ණය හා ණය සහායක සේවා (Credit Plus Services) ලබා දීම පහසු කිරීමට ප්‍රාදේශීය කාර්යාල කටයුතු කරයි.

**පුහුණුව හා මානව සම්පත් සංවර්ධන සහාය (Training & Human Resource Development Assistance)**

මේ යටතේ මූල්‍ය අංශයේ බැංකු හා බැංකු නො වන ආයතනවල මානව සම්පත් සංවර්ධනය

සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා ඒවා පැවැත්වීම ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරන තවත් වැදගත් කාර්යයකි. මෙම වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියෙස ඇතුළු විවිධ දෙපාර්තමේන්තු සහ මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණ පුහුණුකරුවන්ගේ සහාය ලබා ගනු ලැබේ. මේ යටතේ නීත්‍යානුකූල නො වන පුද්ගලයන් හා ආයතන සමග මූල්‍ය ගනුදෙනු කිරීමේ අවදානම, රජයේ සුරැකුම් පත්වල ආයෝජනය හා ඒවායේ ආයෝජනය කිරීමේ වාසි, පිරමීඩ ක්‍රම ඇතුළු ජාලගත අලෙවි ක්‍රමවල ආයෝජනය කිරීමේ නීති විරෝධී බව හා අවදානම, නිර්ව්‍යාජ මුදල් නෝට්ටුවල ආරක්ෂක සලකුණු හා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පිරිසිදු මුදල් භාවිත කිරීමේ ප්‍රතිපත්තිය, විදේශ විනිමය පාලන නීති රීති හා එහි නව ප්‍රවණතා, ශ්‍රී ලංකාවේ ගෙවීම් හා පියවීම් පද්ධතිය හා එහි මෑත කාලීන සංවර්ධනය, මූල්‍ය විශුද්ධිකරණය හා මූල්‍ය බුද්ධි ඒකකයේ කටයුතු, සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු පිළිබඳ ව සේව්‍ය හා සේවක පිරිස් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන් රාශියක් පවත්වනු ලැබේ.

වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය කරන කර්මාන්තකරුවා හා කෘෂි ව්‍යාපාරිකයා සිය ව්‍යාපාර සාර්ථක කර ගැනීමට නම් වෙළෙඳපොළ ඉල්ලන භාණ්ඩ හා සේවා අවශ්‍ය ප්‍රමිතියෙන් සැපයිය යුතු වේ. ඒ සඳහා නිෂ්පාදකයාට හා නිෂ්පාදන කාර්ය මණ්ඩලයට අදාළ කාර්යය පිළිබඳ ව මනා හැකියාවක් හා දක්ෂතාවක් තිබීම අත්‍යවශ්‍ය වේ. මේ අනුව ව්‍යවසායකයින් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල සඳහා සමාජ සජීවීකරණය, නායකත්වය, ව්‍යවසායකත්වය ඇතුළු පෞරුෂත්ව වර්ධන පුහුණු හා විවිධ ආදායම් උත්පාදන මාර්ග පිළිබඳ ව කුසලතා වර්ධන පුහුණු වැඩසටහන් සහ ව්‍යාපාර කළමනාකරණ පුහුණු වැඩසටහන් රාජ්‍ය හා රාජ්‍ය නො වන වෘත්තීය පුහුණු ආයතනවල සහායෙන් සංවිධානය කිරීම ද ප්‍රාදේශීය කාර්යාල සිදු කරන තවත් වැදගත් කාර්යයකි. මේ යටතේ පාසැල් හැර යන තරුණ තරුණියන්, ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන්, ගොවීන් හා කෘෂි ව්‍යාපාරිකයින් හා එම ආයතන හා සම්බන්ධ සේවකයින් ඉහත ක්ෂේත්‍රයන්හි පුහුණු කරනු ලැබේ.

### තාක්ෂණික සහාය (Technical Assistance)

වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී අදාළ භාණ්ඩයේ හෝ සේවාවේ පිරිවැය හා ප්‍රමිතිය පිළිබඳ ව විශේෂ අවධානය යොමු කළ යුතු වේ. පාරිභෝගික ආකර්ෂණය නිරන්තරයෙන් යොමු වනුයේ ඉහළ ප්‍රමිතියෙන් හා අවම මිලකින් යුත් භාණ්ඩ හා සේවා වෙත ය. එම නිසා වෙළෙඳපොළ ජය ගැනීමට උත්සාහ කරන නිෂ්පාදකයා කළ යුත්තේ අවම පිරිවැයක් යටතේ ඉහළ ගුණත්වයකින්, නිමාවකින් හා ප්‍රමිතියකින් යුතු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කොට වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම යි.

මේ සඳහා නිෂ්පාදකයා සිය නිෂ්පාදන ක්‍රියාවලියට "නිවැරදි විධික්‍රම" හෙවත් "තාක්ෂණය" හඳුන්වා දිය යුතු වේ. එ තුළින් අදාළ කර්මාන්තකරුට පාරිභෝගික ආකර්ෂණය දිනාගත හැකි උසස් තත්ත්වයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ හැක. මෙ සේ නිෂ්පාදන ක්‍රියාවලියට "නිවැරදි විධික්‍රම" හෙවත් "තාක්ෂණය" ලබා දීම සඳහා වන පුද්ගලික හා රාජ්‍ය අංශයේ සුවිශේෂී ආයතනවලින් සමන්විත යාන්ත්‍රණයක් රට තුළ ක්‍රියාත්මක වන අතර ඒවායේ සහාය කාර්යක්ෂම ව නිෂ්පාදකයා වෙත ලබා දීම සඳහා ප්‍රාදේශීය කාර්යාල සෘජු ව මැදිහත් වේ. මෙහි දී ප්‍රාදේශීය කාර්යාල අදාළ තාක්ෂණික සේවා සපයන ආයතනවල සහායෙන් වෙළෙඳපොළ සඳහා භාණ්ඩ හා සේවා නිපදවන නිෂ්පාදකයින් සඳහා තාක්ෂණික සහායක වැඩසටහන් සංවිධානය කරයි. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල තාක්ෂණික සහායක සේවා ලබා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදකයන් නිරන්තරයෙන් යොමු වන ජනප්‍රිය කාර්යාලයක් බවට පත් ව ඇත.

### අලෙවි සහාය ( Marketing Assistance)

අවම පිරිවැයක් යටතේ ඉහළ ගුණාත්මකභාවයකින්, නිමාවකින් හා ප්‍රමිතියකින් යුතු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කොට වෙළෙඳපොළට ඉදිරිපත් කරන බොහෝ නිෂ්පාදකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා හොඳ මිලක් හා ස්ථිර වෙළෙඳපොළක් නො මැතිකම යි. මෙම ගැටලුව විසඳීමට සහාය වීම පිණිස සහ භාණ්ඩ හා සේවා නිෂ්පාදන විවිධ වෙළෙඳපොළවලට හඳුන්වා දීමේ අරමුණෙන් වෙළෙඳ ප්‍රදර්ශන හා අලෙවි පොළ (Trade Exhibitions & Trade Fairs) සංවිධානය, විකුණුම්කරුවන්ගේ හා ගැනුම්කරුවන්ගේ හමු (Buyer & Seller Dialogues - BSDs) සංවිධානය, සමාජ ප්‍රාග්ධනය (Social Capital) ගොඩ නැංවීම තුළින් නිෂ්පාදකයා ශක්තිමත් කිරීමේ අරමුණෙන් ඔවුන්ගේ ප්‍රජා මූල සංවිධාන (Community Based Organizations - CBOs) පිහිටුවීම, අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ විකුණුම්කරුවන්ගේ හා ගැනුම්කරුවන්ගේ දත්ත පද්ධතියක් පවත්වා ගැනීම, නිෂ්පාදකයින් හා ගැනුම්කරුවන් අතර ඉදිරි වෙළෙඳ ගිවිසුම් (Forward

Sales Contracts) ජනප්‍රිය කිරීම සඳහා කටයුතු කිරීම, කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයන ආයතනවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අරමුණින් "පොදු හා පෞද්ගලික සංවාද" (Public Private Dialogues - PPDs) සංවිධානය කිරීම, ව්‍යාපාර හා වෙළෙඳ නාම ලියාපදිංචිය, පේටන්ට් හිමිකම් හා ප්‍රමිති සහතික ලබා ගැනීම ඇතුළු විවිධ අනුමැති ලබා ගැනීමේ දී නිෂ්පාදකයින් වෙත සහාය වීම ආදී කටයුතු ප්‍රාදේශීය කාර්යාල විසින් සිදුකරනු ලැබේ.

මේ අනුව ප්‍රාදේශීය හා ජාතික වශයෙන් කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සංවර්ධනයේ දී කර්මාන්තකරුවන් හා කෘෂි ව්‍යාපාරිකයින් ඇතුළු ව්‍යවසායකින් වෙත මූල්‍ය සහාය සැපයීම, පුහුණුව හා මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය සහාය ලබා දීම, තාක්ෂණික සහාය ලබා දීම සහ අලෙවි සහාය සැපයීම ආදිය තුළින් ප්‍රදේශයේ අමුද්‍රව්‍යවලින් උපරිම ප්‍රයෝජනය ගනිමින් වැඩි වැඩියෙන් ප්‍රදේශයේ කර්මාන්ත හා කෘෂි ව්‍යාපාර සඳහා ඒවා යොදා ගැනීම තුළින් ප්‍රාදේශීය නිෂ්පාදනය වර්ධනය වීම හා දළ ජාතික නිෂ්පාදිතය සඳහා වන ප්‍රාදේශීය දායකත්වය වර්ධනය කිරීමට, සේවා නියුක්තිය වර්ධනයට, අපනයන ඉපැයීම් වර්ධනයට හා ආනයන වියදම අඩු කිරීමට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල කටයුතු කරයි. මීට අමතර ව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු ප්‍රාදේශීය මට්ටමින් සිදුකරන කටයුතුවල දී විවිධ අන්දමින් සහාය වීම ද ප්‍රාදේශීය කාර්යාල සිදුකරන තවත් වැදගත් කටයුත්තකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මේ සියලු දේ මගින් ප්‍රදේශයේ කර්මාන්තකරුවන් හා කෘෂි ව්‍යාපාරිකයින් ඇතුළු සමස්ත ජනතාවගේ ආදායම වර්ධනයට සහාය වෙමින් ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ආයතනයක් බවට පත් ව ඇත.■




රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.